# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

## METH SAVIYA NEWS LETTER

❖ සාමාජිකයින් සඳහා තොරතුරු පත්‍රිකාව ❖ 2008 දෙසැම්බර් ❖ මෙත් සවිය හයවන කාණ්ඩය ❖ දෙලොස්වන කලාපය




නිතින් මෙත් සිතින් මම් වෙසෙම් වා
ගතින් මෙත් සිතින් රෝ මුදම් වා
බැතින් තුන් රුවන් ඔප් නගම් වා
මෙතින් නෙත් පියම් වා නිවෙම් වා


ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ - 06

දු.ක: 0714 014467 දුක/ෆැක්ස්: 011 2505088 වෙබ් අඩවිය: www.methsaviya.org විද්‍යුත් තැපෑල: office@methsaviya.org

# මෙත් සවිය ආවර්ජනා........





සෑම මසකම පළමුවන ඉරුදින කොළඹ - 7, ධර්ම ගවේෂි බෞද්ධ ආශ්‍රමයේදී පවත්වනු ලබන ධර්ම දේශනා වැඩසටහන් වලින් කිහිපයක්. පූජ්‍යපාද මිරිස්සේ ධම්මික හිමි, පූජ්‍යපාද වතුරුගම නන්දසිරි හිමි (2-11-2008).





14 වන භාවනා වැඩසටහනේ, අවස්ථා කීපයක්.....



කලා ශූරී අරිසෙන් අහුබුදු ශූරීන් විසින් රචිත "පංචශීලය හෙළ බසින්" ග්‍රන්ථය දොරට වැඩීම.




## ආචාර්ය චන්දන ජයරත්නයන් වෙත,



"ශාසන දීපන" ගෞරව නාමය සමස්ත ලංකා බෞද්ධ මහා සම්මෙලනය මගින් පිරිනැමීම.



"ලෝකාර්ථචාරි විද්‍යාවාචස්පති දේශමාන්‍ය" ගෞරව නාම සම්මාන උපාධිය, ජාතික සම්මාන උපාධි සරසවි ආයතනය මගින් පිරිනැමීම.



"නාලන්දා කීර්ති ශ්‍රී" ගෞරව නාමය නාලන්ද විද්‍යාලය මගින් පිරිනැමීම.

# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ - 06

දු.ක: 0714 014467 දුක/ෆැක්ස්: 011 2505088 වෙබ් අඩවිය: www.methsaviya.org විද්‍යුත් තැපෑල: office@methsaviya.org

### අප ගැන වචනයක්.....

මෙත් සවිය සංසදය නිර්වුල් මනසක් ඇති වර්ධනය කරගත් මානසික ශක්තියක් සහිත බුද්ධිමත් ශ්‍රී ලංකික ජනතාවක් බිහි කිරීමේ අරමුණින් අරඹන ලද සාමාජිකයන්ගේ එකතුවකි. ඒ ඒ ක්ෂේත්‍රයන්ට අදළ විශේෂඥයින් හා උගතුන් ගෙන්වා සාමාජිකයන් දැනුවත් කරනු වස් විවිධ වැඩසටහන් මෙමඟින් පැවැත්වීමට බලාපොරොත්තු වනු ලැබේ. වැඩසටහන් සඳහා මාතෘකා තෝරා ගැනීමද සාමාජිකයන්ගේ කැමැත්ත/ඉල්ලීම මත සිදුකරනු ලැබේ. සංසදය විසින් පවත්වනු ලබන සාර්ථකව ඉගෙන ගන්නා අන්දම හා විභාග සමත් වන අන්දම, කාල කළමණාකරණය, නායකත්වය ත්‍රෛමාසික චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වැනි ඒ ඒ කාල වලදී පවත්වන වැඩසටහන් සඳහා සහභාගී වීමේ වරප්‍රසාදය සියලු සාමාජිකයන්ට හිමිවේ. මීට අමතරව සාමාජිකයන්ගේ දැනුම හා ශික්ෂණය වර්ධනය කිරීම සඳහා සෑම මාස තුනකටම වරක් දාන-සීල-භාවනා වැඩසටහන්ද පවත්වනු ලැබේ. සංසදයේ ප්‍රධාන නිලතල දරණ විධායක කමිටු හා ක්‍රියාකාරී කමිටු සාමාජිකයන් මාංශ භක්ෂනයෙන් හා රහමෙර පානයෙන් තොර දිවි පැවැත්මක් ඇති අය වීම මෛත්‍රී පෙරදැරිව කටයුතු කරන මෙම සංසදයේ විශේෂත්වයකි.

## මෙත් සවිය - විධායක කමිටුව 2008

**ගරු අනුශාසකවරු**
ශ්‍රී විනයාචාර්ය ශ්‍රී ධර්ම රක්ෂිත
වංසාලංකාර අතිපූජ්‍ය
අහංගම ආනන්ද මහා සථිවිරයන්
වහන්සේ

**අතිපූජ්‍ය**
මඩවල උපාලි මහා සථිවිරයන්
වහන්සේ

**ගරු සභාපති**
විද්‍යා කීර්ති, විශ්ව විද්‍යා අධිමානසික
විද්‍යාවේදී, ශාසනදීපන, ලෝකාර්ථචාරී,
විද්‍යාවාචස්පති දේශමාන්‍ය,නාලන්දා කීර්ති ශ්‍රී
ආචාර්ය චන්දන ජයරත්න මහතා

**ගරු උප සභාපතිවරු**
ඉංජිනේරු සරත් ඉලංගන්තිලක මහතා
නිහාල් මෙන්ඩිස් මහතා

**ගරු සම ලේකම්වරු**
තුසිත දොඹගොඩ මහතා
චමින්ද බලවෙදගේ මහතා

**ගරු භාණ්ඩාගාරික**
වාසනා රණසිංහ මහතා

**ගරු උප භාණ්ඩාගාරික**
ජනක සුවඳරත්න මහතා

**සංස්කාරක**
සෙනරත් බණ්ඩාර බුළුමුල්ල මහතා

**පරිගණක සංස්කාරක සහ වෙබ් අඩවි කළමණාකරු**
චමිල ප්‍රසන්න මහතා

**ගරු කාරක සභිකවරු**

නාලක එදිරිසිංහ මහතා
පී. සූරියආරච්චි මහතා
සුසන්ත යාපා මහතා
රංජිත් සොයිසා මහතා
රොෂාන් ඉන්දු මහතා
බංදු අබේරත්න මහතා

## සාමාජිකයින් සඳහා වැදගත් තොරතුරු සහ ඉදිරි වැඩසටහන් පිළිබඳ විස්තර

### 2009 ජනවාරි 01 දින වසරේ ප්‍රථම හීල් දනය

2009 ජනවාරි 01 දින කොළඹ 02 හුණුපිටියේ ගංගාරාම විහාරස්ථානයේදී වර්ෂය ආරම්භ කිරීම නිමිති කොට ගෙන පවත්වනු ලබන හීල් දානමය පුන්‍යකර්මය සඳහා සහභාගීවීමට කැමති මෙත්සවිය සාමාජිකයන් එදින පෙ.ව.6.00 ට ගංගාරාමය වෙත පැමිණිය යුතුය. පෙ.ව 6.30 ට කේෂධාතුන් වහන්සේ වෙත බුද්ධ පූජාව පැවැත්වේ. පෙ.ව.7.00 ට මහා සංඝ රත්නය විෂයෙහි හීල් දානය පැවැත්වේ.මේ සඳහා අවශ්‍ය කිරිබත්, ලුණු මිරිස්, ඉඳිආප්ප, පරිප්පු, අල හොදි, සීනි සම්බෝල, මුං ඇට, පළතුරු, කැවිලි, පිරිකර ආදී දානමය ද්‍රව්‍ය භාරගැනීමට කැමති පින්වතුන් ඇත්නම් ගරු ලේකම් තුසිත දොඹගොඩ මහතා (දු.ක.0714454411) අමතා තොරතුරු ලබාගන්න.

### මෙත් සවිය වාර්ෂික මහා සභා රැස්වීම 2009.01.04 දා

මෙත් සවිය වාර්ෂික මහා සභා රැස්වීම 2008 අයවැය ඉදිරිපත් කිරීම හා නිලධාරී මණ්ඩලය පත් කර ගැනීම 2009 ජනවාරි මස 04 වනි ඉරු දින ප.ව.3.00 ට පැවැත්වේ. එදින ප.ව.2.00 - 3.00 දක්වා කොළඹ 07 බෞද්ධාලෝක මාවතේ ධර්ම ගවේෂී බෞද්ධ ආශ්‍රමයේ දී පැවැත්වෙන ධර්ම දේශනාව අවසානයේ දී මෙය පැවැත්වෙනු ඇත. 2009 මෙත්සවිය දින දර්ශනය එදිනට ලබා දීමට බලාපොරොත්තු වේ. එදින සාකච්ඡාව සඳහා නව යෝජනා ඇත්නම් කාර්යාලයට භාර දෙන්න.මෙතෙක් සාමාජිකත්වය අලුත් නොකර ඇති සියළුම දෙනා වාර්ෂික මහා සභා රැස්වීමට ප්‍රථම සාමාජිකත්වය අලුත් කරගන්නා ලෙස ඉල්ලා සිටිමු.

හෙලබසට හා ජතියට අනුපමය සෙවාවන් ඉටකර ඇති මෙත් සවිය ගරු සාමාජින කලාශූරි අරිසෙන් අහුබුදු ශූරින්ට ගෞරව උපහාර සම්මානියක් පිරිනැමීමද මෙදින සිදුවේ.

මෙදින ධර්ම දේශණය පවත් වනු ලබන්නේ සුප්‍රකට දේශකයානණ් වහන්සේ නමක් වන රූපවාහිනී මාධ්‍ය මගින්ද නිතර ධර්ම දේශණා පවත් වනු ලබන අගලකඩ සිරි සුමන ස්වාමීන් වහන්සේ විසිණි.

### 15 වන චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන

15 වන භාවනා වැඩසටහන 2009 ජනවාරි අග භාගයේ දී ආරම්භ වනු ඇත. ඒ සඳහා අයදුම් පත්‍ර 2008 දෙසැම්බර් 14 දිනට ප්‍රථම ලැබීමට සලස්වන්න. අයදුම් පත්‍ර සඟරාවේ ඇතුල් පිටුවෙන් හෝ මෙත්සවිය වෙබ් අඩවියෙන් (www.methsaviya.org) ලබා ගත හැක.

### මීලඟ දාන-ශීල-භාවනා වැඩසටහන 2008 දෙසැම්බර් 07 වන ඉරු දින රාජගිරිය කලපලුවාව ගෝතම තපෝවනයේ දී පැවැත්වේ

මෙත් සවිය මගින් වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් පෙ.ව. 7.30 ට බස් රථයක් ද, කොළඹ 7 බෞද්ධාලෝක මාවතේ ධර්ම ගවේෂී බෞද්ධ ආශ්‍රමය අසලින් පෙ.ව. 7.45 ට බස්රථයක් ද තපෝවනය බලා පිටත් කිරීමට කටයුතු යොදා ඇත. වැඩි විස්තර සම ලේකම් චමින්ද මහතා අමතා (0777 390906 / 0777 790076) දැන ගත හැක. (4 වන පිටුවට...)

### මෙත් සවිය ආරම්භ කර ඇති මිරිසවැටිය චෛත්‍යරාජයාණන් වහන්සේගේ සලපතල මළුව ප්‍රතිසංස්කරණ වැඩ අධීක්ෂණය කිරීමේ චාරිකාව 2008 දෙසැම්බර් 26-27

ශ්‍රී විජයාරාමයෙන් 26 වන දින රාත්‍රී 8.00 ට ඉහත කටයුතු සඳහා බස් රථ පිටත් වන අතර, අනුරාධපුර මිරිසවැටිය චෛත්‍යරාජයාණන් වහන්සේගේ සලපතල මළුවේ වැඩ අධීක්ෂණය කිරීමෙන් අනතුරුව, මගපෙන්වන්නෙකු ගේ සහය ඇතිව අටමස්ථානය වන්දනා මාන සිදු කරනු ලැබේ. එදින රාත්‍රී අනුරාධපුරයේ නවාතැන් ගෙන පසු දින (27ද) ඉතිරි සිද්ධස්ථාන වන්දනා මාන ආදිය සිදු කර දිවා ආහාරයෙන් පසු වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය වෙත පැමිණෙනු ඇත. (4 වන පිටුවට...)

# මීලඟ දාන-සීල-භාවනා වැඩසටහන

මීලඟ දාන-ශීල-භාවනා වැඩසටහන හා රුස්වීම 2008 දෙසැම්බර් මස 07 වන ඉරු දින රාජගිරිය කලපලුවාව ගෝතම තපෝවනයේ දී පැවැත්වේ. එදින වැඩසටහනට සහභාගීවන සියළු සාමාජිකයින් සිල් සමාදන් වීමට සුදුසු ඇඳුමින් පැමිණෙන්නේ නම් මැනවි. එදින පැමිණෙන විට හීල් දනය හා දහවල් දනය සඳහා ඔබට හා තවත් කෙනෙකුට සෑහෙනසේ පළතුරු රැගෙන එන්න. මෙත්සවිය භාවනා පවුල්වල සාමාජිකයින් එක්වී (දුරකථන මගින් සාකච්ඡා කර) අවශ්‍ය දානය රැගේන ඒමද සිදුකල හැකිය.

තපෝවනය භාවනා මධ්‍යස්ථානයේ භාවනායෝගී ස්වාමීන් වහන්සේලා 35 නමක් හා ගිහි යෝගීන් කිහිප දෙනෙකු වැඩ වසති. මෙම භාවනා මධ්‍යස්ථානයට පිරිකර පූජා කිරීමට කැමති භවතුන් භාවනා මධ්‍යස්ථානයට දැනට හිගව පවතින පහත සඳහන් ද්‍රව්‍ය වලින් (ගරු නායක ස්වාමීන්ද්‍රයන්ගෙන් හා ලියන මහතාගෙන් අප කල විමසීමෙන් දැනගත් පරිදි) යමක් පූජා කරන්නේ නම් එය විචාර බුද්ධියෙන් කරනු ලබන මහත් පුණ්‍යකර්මයක් වනු ඇත. භාවනා කරන ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් මදුරු දැගර, රෙදි පාපිසි, බල්බ්, ඉදල්, සබන්, දත් බෙහෙත්, ටෝච්, ඉටිපන්දම්, පෙන්ටෝච් බැටරි හා ඉගෙන ගන්නා ස්වාමීන් වහන්සේලාට අවශ්‍ය A4 කඩදසි කොල, පොත් පත්, බෝල්ට් පොයින්ට් පෑන් ආදිය දැනට අවශ්‍ය ද්‍රව්‍යයයි. මීට අමතරව මධ්‍යස්ථානයේ නඩත්තු කටයුතු (තීන්ත ආලේපන වැනි) සඳහා මුදල් පරිත්‍යාගයන් ද කල හැක. (මේ පිළිබඳ වැඩි විස්තර අවශ්‍ය නම් මෙත් සවිය දාන-ශීල-භාවනා වැඩසටහනේ සංවිධායක සරත් ඉලංගන්තිලක මහතා වෙත දු.ක. 0714340107 මගින් අමතා දැනගත හැක.)

සහභාගී වන අය වෙනුවෙන් ගිලන්පස පූජාව (උදේ-සවස) දීමට කැමති අයට භාරගත හැක. (කාර්යාලයට දන්වන්න.) එදින පෙ.ව. 8.00 වන විට කලපලුවාව ගෝතම තපෝවනයේදී අටසිල් දීමට බලාපොරොත්තු වන බැවින් පුද්ගලිකව පැමිණෙන පිංවතුන් පෙ.ව. 8.00 වන විට තපෝවනයට පැමිණ සිටිය යුතුය. (බොරැල්ල බස්නැවතුම් පලෙන් මාර්ග අංක 150 බස් රථයෙන් පැමිණෙන විට තපෝවනය අසලින් බැසීම සිදු කළ හැකිය. ලිපිනය - ගෝතම තපෝවනය, කලපලුවාව, මුල්ලේරියාව-නව නගරය) මීට අමතරව මෙත් සවිය මගින් වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයෙන් පෙ.ව. 7.30 ට බස් රථයක් ද, කොළඹ 7 බෞද්ධාලෝක මාවතේ ධර්ම ගවේශී බෞද්ධ ආශ්‍රමය අසලින් පෙ.ව. 7.45 ට බස්රථයක් ද තපෝවනය බලා පිටත් කිරීමට කටයුතු යොදා ඇත. වැඩි විස්තර සම ලේකම් චමින්ද මහතා අමතා (0777 390906 / 0777 790076) දැන ගත හැක. ප.ව. 4.00 ට වැඩසටහන අවසන් වූවාට පසු අවශ්‍ය අයට බොරැල්ලට පැමිණීමටද බස් රථ සේවාව යොදවා ඇත. මෙත්සවිය බස් රථ යොදාගන්නේනම් බර පැන රු.80/= ක් වේ. මීට අමතරව ප.ව. 4.30 ට තපෝවනයෙන් පිටත් වන අවසාන බස් රථය බොරැල්ල හරහා වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය දක්වා ගමන් කරනු ඇත.

## මෙත් සවිය මගින් ආරම්භ කර ඇති මිරිසවැටිය චෛත්‍යරාජයාණන් වහන්සේගේ සලපතල මළුව ප්‍රතිසංස්කරණ වැඩ අධීක්ෂණය කිරීමේ චාරිකාව 2008 දෙසැම්බර් 26 සහ 27

කොළඹ 06 ෆෙඩ්රිකා පාරේ ශ්‍රී විජයාරාමයෙන් 26 වන දින රාත්‍රි 8.00 ට ඉහත කටයුතු සඳහා වායුසමනය සහිත බස් රථ පිටත් වන අතර, අනුරාධපුර මිරිසවැටිය චෛත්‍යරාජයාණන් වහන්සේගේ සලපතල මළුවේ වැඩ අධීක්ෂණය කිරීමෙන් අනතුරුව, මගපෙන්වන්නෙකු ගේ සහය ඇතිව අටමස්ථානය වන්දනා මාන සිදු කරනු ලැබේ. ආපසු හවස 4ට අනුරාධපුරයේන් වැල්ලවත්ත ශ්‍රී විජයාරාමය වෙත පැමිණෙනු ඇත.

මෙම මහා පුණ්‍යකර්මය සඳහා දයක වීමට කැමති මිරිසවැටිය චෛත්‍යයේ සලපතල මලුවේ ගල් ඇතිරීම සඳහා මුදල් පරිත්‍යාග කල සියළු පින්වතුන්ට හා ඔවුන්ගේ පවුල් වල අයටත් මීට අමතරව මෙත්සවිය ඕනෑම සාමාජිකයෙකුට හා ඔවුන්ගේ පවුල් වල අයටත් සහභාගී විය හැක. (ප්‍රමුඛතාව සලපතල මළුව සහ ශ්‍රී විජයාරාමයේ ධර්ම ශාලාව ප්‍රිතිසංස්කරණය සදහා සඳහා මුදල් පරිත්‍යාග කල අයට හා පවුලේ සාමාජිකයිනට හිමිවනු ඇත.)
26වනදා රාත්‍රි ආහාරය ගමන පිටත්වීමට පෙර තමන් විසින් සපයා ගන්න. පසුදින නවාතැන් පහසුකම්ද සමගින් උදැසන සහ දිවා ආහාරය මෙත්සවිය මගින් ලබාදීමට කටයුතු සූදානම් කරඇත.
මේ සඳහා ගමන් ගාස්තු හා ආහාර පාන සඳහා වැයවන බැරපැන ගෙවීම සහ බස්රථ ආසන වෙන් කිරීම 2008.12.19 දිනට ප්‍රථම කාර්යාලයට පැමිණ සිදු කල හැක. මේ වෙනුවෙන් ඔබට දැරීමට වන බරපැන ප්‍රමාණය 2008 දෙසැම්බර් මුල් සතිය තුලදී කාර්යාලයෙන් විමසා දැන ගත හැක. (දු.ක. 0714 014467/0112 505088) වායු සමනය කල බස් රථ මෙම ගමන සඳහා යොදවනු ඇත.

## අපගේ ආශිර්වාදය හා පුණ්‍යානුමෝදනාව

2008.09.07 ඉරු දින වාරණ ශාන්ත තපෝවනයේ පැවති අපගේ ත්‍රෛමාසික දන-ශීල-භාවනා වැඩසටහන සංවිධානය කල හා ගිලන්පස පූජා කල ප්‍රේමරත්න සූරිය ආරච්චි මහතා හා චන්ද්‍රා සූරිය ආරච්චි මහත්මියත් එම දෙපලගේ දරුවනුත්, ආර්.ඩබ්. ගුණරත්න මහතා හා ආර්.චන්ද්‍රලතා මහත්මියත් ඔවුන්ගේ සියළුම මළගිය ඥාතීන් වෙත.

එදින වාරණ ශාන්ත තපෝවනයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු.45,000/=ක මුදලක් පරිත්‍යාග කිරීමට දායක වූ මෙත්සවිය සියළුම සාමාජික සාමාජිකාවන් හා ඔවුන්ගේ සියළුම මළගිය ඥාතීන් වෙත.

මෙත්සවිය භාවනා වැඩසටහන් ආරම්භයේ දී සාමාජිකයින් වෙත බෙදා දෙනු ලබන භාවනාව හා බුද්ධ වන්දනාව පොත් 400 ක් මෙත්සවියට පූජා කල සාමාජිකා උදයානි ජයසූර්ය මහත්මියට හා එම මහත්මියගේ සියළුම මළගිය ඥාතීන් වෙත.

## ශ්‍රී විජයාරාමයේ ධර්මශාලා ප්‍රතිසංස්කරණ අරමුදල

අට මහා කුසලයන්ගෙන් එකක් වන ආවාස, ධර්මශාලා තැනීමේ මහා පුණ්‍ය කර්මය මෙත්සවිය මගින් වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ ධර්ම මන්දිරය ප්‍රතිසංස්කරණය කිරීමෙන් ආරම්භකර ඇති නිසා මේ සඳහා සුළුවෙන් හෝ ආධාර කර මහත් වූ කුසලයන් රැස්කර ගන්නා ලෙස මතක් කරමු.

දැනටමත් මේ වෙනුවෙන් ණය මුදලක් යටතේ පන්සලට ගෙනවිත් ඇති ටයිල් වලින් ටයිල් කැටයකට (රු.450/= වහලයේ සිට පොලව තෙක් වර්ග අඩියක් සැදීම සදහා යන වියදම) හෝ කිහිපයකට දයක වන ලෙස ද මතක් කරමු. මේ සඳහා මුදල් කාර්යාලයට භාරදී පිං පත්‍රිකාවක් ලබා ගෙන ටයිල් කැට ස්වාමීන් වහන්සේට පූජා කරන්න .


## මෙත්සවිය ප්‍රාණඝාතය වලකමු CD තැටිය නැවත මුද්‍රණය කොට බෙදා හැරීම

2550 සම්බුද්ධ ජයන්තිය වෙනුවෙන් ඉහත CD තැටි 2550 මුද්‍රණය කොට විහාරස්ථාන දහම් පාසැල්, වෙනත් පුණ්‍ය ආයතන වෙත නොමිලේ බෙදා හැරිය මුත් ඒ සඳහා ඇති අධික ඉල්ලුම සපුරාලීමට නැවත CD තැටි මුද්‍රණය කිරීමට අවශ්‍ය වී ඇත. මෙය නැරඹූ බොහෝ දෙනා මස්, මාළු අනුභවය නවතා ඇත. CD තැටියක් නිෂ්පාදනය සඳහා බරපැන (කවරයද සමඟ) රු. 100 බැගින් කැමති ප්‍රමාණයකින් දායක විය හැක.

CD තැටි 100 වඩා මුද්‍රණ අනුග්‍රහය දක්වන භවතුන්ගේ නම හෝ ආයතනයේ නම CD තැටියේ සහ කවරයේ මුද්‍රණය කල හැක.

# මෙත් සවිය සභාපතිට වසරක කාලයක් තුල ගෞරව නාම තුනක්

මෙත් සවිය සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා වෙත මීට ඉහත දී මහනායක හිමිවරුන්ගෙන් හා විවිධ ආයතන වලින් ලබා දී ඇති විද්‍යා කීර්ති, විශ්ව විද්‍යා අධිමානසික විද්‍යාවේදී, ශාසනදීපන, ලෝකාර්ථචාරී, විද්‍යාවාචස්පති දේශමාන්‍ය යන ගෞරව නාමයන්ට අමතරව මෙතෙක් ගරු ජනාධිපති තුමන්, දළඳ මාලිගාවේ දියවඩන නිලමේ නිලංග දෑල බණ්ඩාර, කලා ශූරි හෙන්රි ජයසේන හා නාසා ආයතනයේ ආචාර්ය සරත් ගුණපාල යන මහතුන්ට පමණක් ලබා දී ඇති <u>නාලන්ද කීර්ති ශ්‍රී</u> නාමයෙන් පසු ගිය 16/10/2008 කොළඹ බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවති උත්සවයක දී කොළඹ නාලන්ද විද්‍යාලීය විදුහල්පති ප්‍රේමතිලක මහතා අතින් ලබා දෙන අවස්ථාව සඳහා හේතු පාඨ පහත දැක්වේ.




### සිද්ධි රස්තු !

ශ්‍රී ලංකා මාතාවටත් සිප්සතර හැදෑරූ නාලන්දා පුණ්‍ය භූමියටත් අභිමානවත් ගෞරවයක් අත්කර දුන් සැදැහැබර සුජාත පුත්‍ර ආචාර්ය චන්දන ජයරත්න ශ්‍රීමතාණෙනි, නාලන්දව නම් සුගන්ධ කමල විල අති සුගන්ධවත් කළ අරවින්දයන් අතර අරවින්දයක් වූ ඔබ නිසා ශ්‍රී ලංකා ධරණිතලයම සුවඳවත් වන්නේය, නාලන්දවෙන් ලද විවිධ වූ දැනුම් සම්භාරයත් හේතුකොට ගෙන ලැබූ පන්නරයෙන් ශක්තිමත් පදනමක් ගොඩනගා ගනිමින්, කොළඹ විශ්ව විද්‍යාලයට ඇතුලත්ව භෞතික විද්‍යාව පිළිබඳව විද්‍යාවේදී ගෞරව උපාධියක්ද, වායුගෝලීය භෞතික විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය ද ඇතුළුව විවිධ විෂයක්ෂේත්‍රයන් පිළිබඳව අධ්‍යයනයන් රැසක්ද ලබා රට දැය සමයට දිරිදෙන ජාතික වස්තුවක් බවට ඔබතුමන් පත්ව සිටී. එපමණක් නොව දේශ දේශාන්තරයෙහි සිය නාමය ප්‍රචලිත කරගනිමින් අකුණු සැර වැළැක්වීමට, ඕසෝන් ස්ථරය, සුනාමි ව්‍යසනය සහ චන්ද්‍රිකා තාක්ෂණය ආදී විවිධ විෂයන්හි පරිනත විධග්ධ පඬිවරයෙකු වෙමින් ප්‍රකාශන අසූවකට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත්කොට ඇත. විද්‍යාඥයකු, චතුර දේශකයෙකු පමණක් නොව අධ්‍යාත්මික ගුණ වගාවෙන් පිං පිරූ සැදැහැවතෙකු බවට පත්ව සිටී. එබැවින් නාලන්ද මාතාවගේ ජ්‍යෙෂ්ඨතම පුත්‍රයෙකු වන විද්‍යාකීර්ති ආචාර්ය චන්දන ජයරත්න ඇඳුරුතුමාණෙනි, ඔබට නාලන්දවේ උත්තරීතර සම්මානය වන "නාලන්දා කීර්ති ශ්‍රී" සම්මානය ශ්‍රී බුද්ධ වර්ෂ 2552 ක් වූ වප් මස 16 වන අව දියවක ලත් ගුරු දින කොළඹ බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ගෞරව බහුමානයෙන් යුතුව පුදකළ වගයි.

විදුහල්පති නාලන්දා විද්‍යාලය
සභාපති
නාලන්දා ආදී බාලදක්ෂ සංගමය

මීට අමතරව

2. ආචාර්ය චන්දන ජයරත්න මහතා විසින් දිවිහිමියෙන් ඇප කැප වී බොදු සසුනේ තිර පැවැත්ම උදෙසාත්, රට දැයෙහිත්, සමාජයෙහිත්, අභිවර්ධනය පිණිසත් සැදැහැවෙන්, ගුණ නුවනින් යුතුව ඉටු කරන ලද අකල්ප අනලස් සේවය අගය කරමින් සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය විසින් "ශාසන දීපන" ගෞරව ප්‍රසාදය 2007 ඔක්තොම්බර් 20 වන දින ද

3. ශ්‍රී ලංකා ජන හද දිනූ සම්භාවනීය විද්වතානන්ගේ ප්‍රවීනතාවයට, විශිෂ්ඨ සේවයට, සහජ දක්ෂතාවයට හා සාධුචර්යාවට පිරිනමන උපහාරයක් ලෙස "ලෝකාර්ථචාරී විද්‍යාවාචස්පති දේශමාන්‍ය" ජාතික නාම ගෞරව නාම සම්මාන උපාධිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අනුමත ජාතික සම්මාන උපාධි සරසවි ආයතනය මගින් 2008 අගෝස්තු 8 වන දින ද

### <u>මිණි පහනකි භාවනා</u>

ආලෝකයකි දසත පැතිර යන
නෙතු පියන් හැර බැලුවෙමි
මතු වී පෙර පිනක්
එසවිනි මා දෙපා යුග
දිවි මග සරසාලන
අගනා ඔවා මිණි මුතු පිරි
'මෙත් සවිය' රන් මැදුරට
දයාබර ගුරු පියාණනි,
උතුම් බුදු ගුණ මහිමයෙන් හෙබි
ඔබේ පින්බර හදවතින් දල්වා
මා වෙත ලබා දුන්
භාවනා මිණි පහන
අධිෂ්ඨානයෙන් හා වීර්යයෙන් යුතුව
කිසි දිනක නිවී යා නොදී
සුරැකිව රැකගෙන යන්නෙමි
සසර කෙළවර
නිවන් දොර අභියසට ම...

සාමාජිකා 13-2257
එම්.පී. මදුරසිංහ

දසත විසිරුනා වූ සිතිවිලි
එක්තැන් කර
සිත නිවා සනසාලන්නට
ඔබෙන් ලැබුනා වූ හරවත් මුදු වදන්
මනා පිටුවහලක් විය...
දිවියේ යථා ස්වභාවය
මේ යයි පසක් කොටලන්නට
නිරුදක කතරක් බඳුව තිබූ
ජීවිතයේ, කෙම් බිමක් සොයා යන්නට
මග කියා දුන් ඇඳුරුතුමනි,
ඔබට බෙහෝ පිං...

මෙත් සවිය සාමාජිකා
කාන්ති කල්පගේ
12-2067

**මිරිසවැටිය සලපතල මළුවට 2008.01.01 සිට 2008.09.30 දක්වා රු.5000/=ට වැඩියෙන් ආධාර කල පින්වතුන්**

| | | |
|---|---|---|
| 1. 2-502 | ප්‍රියවතී කඳනආරච්චි මහත්මිය | රු.54,250.00 |
| 2. 11-2023 | කමාජ් වනිගසූරිය මහතා | රු.26,500.00 |
| 3. 12-2152 | චම්පිකා අල්විස් මෙනවිය | රු.10,000.00 |
| 4. 12-2153 | වෛද්‍ය දයානි අල්විස් මෙනවිය | රු.10,000.00 |
| 5. 12-2066 | චම්පිකා සිරිබද්දන මහත්මිය | රු.10,000.00 |
| 6. 10-1834 | එම්. තිලකරත්න මහතා සහ මහත්මිය | රු.10,000.00 |
| 7. 12-2136 | එම්.ජී. චන්ද්‍රා ලියනගේ මහත්මිය | රු.5,000.00 |
| 8. 12-2138 | ආර්.එම්. පෙරේරා මහත්මිය | රු.5,000.00 |
| 9. 12-2096/95 | භාග්‍යා කුලතුංග මහත්මිය<br>ජයවි ගුණසේකර මහතා | රු.5,000.00 |
| 10.c/o12-2153 | එච්.ඒ.ඩී. තිසේරා මහත්මිය | රු.5,000.00 |
| 11.11-1974 | ආර්. රාසපුත්‍රම් මහත්මිය | රු.5,000.00 |
| 12. | ධම්මිකා කුමාරි මෙනවිය | රු.5,000.00 |
| 13. | පූජ්‍ය මස්තැන්නේ ඉන්ද්‍රරතන හිමි | රු.5,000.00 |
| 14. 9-1623 | ජයන්ත පෙරේරා මහතා | රු.5,000.00 |
| 15. 9-1582 | එන්.කේ.ද. සිල්වා මහත්මිය | රු.5,000.00 |

**මෙත් සවිය සඟරාව 10 වන කලාපයේ පළකරන ලද, මිරිසවැටිය සලපතල මළුවට 2007.12.31 දක්වා ආධාර කල (රු.1000/=ට වැඩි) පිංවතුන්ගේ නාම ලේඛණයේ ප්‍රමාධ දෝෂයකින් නම් පළ නොවූ පිංවතුන්ගේ ලැයිස්තුව**

| | | | |
|---|---|---|---|
| 1. | 1-369<br>3-580 | ජනක සුවඳරත්න මහතා<br>මාලන් මහතා | රු.10,000.00 |
| 2. | 10-1783 | හැරියට් අමරසිංහ මහත්මිය | රු.3,000.00 |
| 3. | 7-1420/21 | එම්.ඩී. ආරියදස මහතා සහ මහත්මිය | රු.3,000.00 |
| 4. | 7-1250 | දිල්හානි මුතුමුදලිගේ මෙනවිය | රු.2,550.00 |
| 5. | 6-1221 | එල්.ඒ.ආර්. තරංගි මෙනවිය | රු.2,000.00 |
| 6. | 1-369 | ජනක සුවඳරත්න මහතා | රු.2,000.00 |
| 7. | 11-1977 | එස්.ටී. ජයසූරිය මහත්මිය | රු.2,000.00 |
| 8. | 9-1618 | වී.අයි. වික්‍රමතිලක මහත්මිය | රු.2,000.00 |
| 9. | 5-1020 | සුජාතා දිසානායක මහත්මිය | රු.2,000.00 |
| 10. | 8-1543 | එස්.සමරජීව මහතා | රු.1,850.00 |
| 11. | 7-1288 | ඊ.බී. ප්‍රේමාවතී මහත්මිය | රු.1,300.00 |
| 12. | 9-1639 | ආර්.ඩී. එස් මාලතී මහත්මිය | රු.1,000.00 |
| 13. | 6-1139 | කේ. අමරකෝන් මහත්මිය | රු.1,000.00 |
| 14. | 8-1436 | ඩේසි ඇලෙක්සැන්ඩර් මහත්මිය | රු.1,000.00 |
| 15. | | තේජා පද්මාංගනී මහත්මිය | රු.1,000.00 |
| 16. | 10-1871 | චම්පා පරණමාණ මහත්මිය | රු.1,000.00 |
| 17. | C/O8-1556 | සුසිලා පීරිස් මහත්මිය | රු.1,000.00 |
| 18. | 10-1810 | එස්.පී. රංග මහතා | රු.1,000.00 |
| 19. | 10-1844 | ඩී.එම්. දසනායක මහත්මිය | රු.1,000.00 |
| 20. | 8-1392 | මහානාම සෝමවර්ධන මහත්මිය | රු.1,000.00 |

## සාමාජිකත්වය අලුත් කිරීම

ඒ සඳහා කාර්යාලයට පැමිණීම අත්‍යාවශ්‍ය නොවන අතර, ඒ වෙනුවෙන් ගෙවිය යුතු රු.500/=ක වාර්ෂික සාමාජික ගාස්තුව මෙත්සවිය නමින් ලියන ලද රේඛණ කල චෙක්පතක් හෝ ගෙවන කාර්යාලය වැල්ලවත්ත ලෙස සටහන් කල මෙත්සවිය නමට එවන සාමාන්‍ය මුදල් ඇණවුමක් තම ලිපිනය ලියූ රු.30/=ක මුද්දර කවරයක් හා පැරණි සාමාජික පත්‍රයද සමග ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයාරාමය, ෆෙඩ්රිකා පාර, කොළඹ 06 වෙත එවීමෙන් අලුත් සාමාජික පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් ලබා ගත හැකි බවද කාරුණිකව දන්වමු.

## පිං පැමිණවීම

නොවැම්බර් මාසයේදි අභාවප්‍රාප්ථවූ මෙත්සවිය සමාජිකා රමණි චන්ද්‍රදාස මහත්මියට (කොට්ටේ ආනන්ද බාලිකා විදුහලේ ගුරුතුමිය) අප කරන කුශල් වල බලයෙන් සඟ මොක් සුව ලැබේවායි ප්‍රාර්තනා කරමු.

# අසරණ සරණ

ඇම්.ඩී. චන්ද්‍රලතා,නො: 439,කොට්ටාව පාර,
අතුරුගිරිය,
ගරු සභාපතිතුමනි,

මා වයස අවුරුදු 11ක් වයසැති එක් දරු මවක්මි. සැමියා මියගොස් දැනට අවුරුදු 6කි. දරුවා හෝමාගම මධ්‍ය මහා විදුහලේ 6 වසරේ ඉගෙනුම ලබයි. මා දැනට සහෝදරයෙකුගේ නිවසේ ඔහුගේ බලවත් අකමැත්ත පිට පදිංචි වී සිටිමි. මට ඔවුන් යන්නට කීවත් යන්නට තැනක් නැත. ගල්වලක රැකියාව කර ලැබෙන සුළු පඩියෙන් ජීවත් වන අපට ගෙවල් කුලියට යාමට වත්කමක් නැත. මා හට පුංචි නිවසක් සාදා ගැනීමට පොඩි ඉඩම් කොටසක් ලබා දීමට හෝ ඉඩම් කොටසක් මිල දී ගැනීමට උපකාරයක් කිරීමට මෙත් සවිය සාමාජික මහත්ම මහත්මීන්ගෙන් ඉතාමත් බැගෑපත් ලෙස ඉල්ලා සිටිමි.

මෙයට,
සාමාජිකා,
ඇම්.ඩී. චන්ද්‍රලතා, සාමාජික අංකය 1866
10 වන කණ්ඩායම

*සභාපතිතුමාගේ අනුමැතිය*

*ඉහත කාන්තාව ඉතා දුකට පත් මහත් දුක් ගැහැට කඳුළු මධ්‍යයේ අත් කරගැට එන තෙක් ගල් වලක ගල් කඩා තම කුඩා පුතාට උගන්වමින් ඉන්න කිසි තැනක් නැතිව ජීවත්වන අසරණ සාමාජිකාවක් බව අපි විමසා දැනගෙන ඇත. ඇයට පිහිට වී පිං ලබා ගන්න. කාර්යාලයෙන් වුව විමසිය හැක.*

**කොළඹ වෛද්‍ය විද්‍යාලයේ පළමු වසරේ ඉගෙනුම ලබන දුප්පත් වෛද්‍ය ශිෂ්‍යයෙකුට මාස් පතා ශිෂ්‍යත්ව මුදලක් ප්‍රධානය කිරීමට කැමති පිංවතෙක් වෙතොත් මෙත්සවිය කාර්යාලයට දන්වන්න.**

## හිතෝපදේශනයෙන් බිඳක්...

'හිතෝපදේශනය' යනු විශ්ව සාහිත්‍ය කෘති ගණයෙහි ලා සැලකෙන සංස්කෘත පොතකි. මෙය එදිනෙදා ජීවිතයේ දී මිනිසෙකුට මුණ ගැසෙන දහසකුත් එකක් ගැටලු වලට පෙර සිටි නැණවත් උගත් මුතුන් මිත්තන් විසින් සිය අත්දැකීම් අනුව සැපයූන අගනා විසඳුම් හා ජීවිතය හරි මගට යොමු කරන උපදෙස් අමා මුසු රසවත් කතා එකතුවක් ලෙස නාරායණ නම් භාරතීය පඬිවරයාණ කෙනෙකු අතින් බිහි වූවකි.

පෙරපර දෙදිග බස් රැසකට පෙරළී ඇති 'හිතෝපදේශනය' බොහෝ කලකට පෙර ලංකාවේ ද භාවිත වී ඇත. මෙහි එන ඇතැම් කතා ගමකතා මෙන් අපේ ජනකතා බවට පත් වී ඇත. සත්ව උපමා සහිත පඤ්ච තන්ත්‍රය පදනම් කොට ලියවුන කෘතියක් ලෙස ද මෙය සැලකේ.

හිතෝපදේශනයේ එන ශ්ලෝක දෙකක් පහත දැක්වේ.

සුමහානත්‍යපි ශාසත්‍රාණි ධාරයනෙතා බහුශ්‍රැතාඃ
ජේතතාරඃ සංශයානාං ච ක්ලිශ්‍යනෙත ලොභමොහිතාඃ

සුමහානත්‍යපි ශාසත්‍රාණි - බොහෝ සතර උගත් , සංශයානාං ජේතතාරඃ ච - සැක සිඳලන්නා වූ ද, බහුශ්‍රැතාඃ
අපි - බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෝ ද, ලොභමොහිතාඃ - ලොබින් මුලා වී, ක්ලිශ්‍යනෙත - කෙලෙසෙති.

ලෝභාත් ක්‍රොධඃ ප්‍රභවති ලොභාත් කාමඃ ප්‍රජායතෙ
ලොභාත් මොහශ්ච නාශශ්ච ලොභඃ පාපස්‍ය කාරණම්

ලෝභාත් ක්‍රොධඃ ප්‍රභවති - ලොබ නිසා තරහ ඇති වේ.
ලොභාත් කාමඃ ප්‍රජායතෙ - ආසාව නිසා කාමය උපදී.
ලොභාත් මොහඃ - ආසාවෙන් මුලාව ද නාශඃ ච - විනාශය ද ඇති වේ.
ලොභඃ පාපස්‍ය කාරණම් - ලොල් කම පවට හේතුව ය.

# දස පාරමිතා

| | පාරමිතා (බෝධිසත්ව පාරමී කිහිපයකි) | සරල පදනම | කෙටි විස්තරය |
|---|---|---|---|
| 01 | දාන පාරමිතාව (වෙස්සන්තර ජාතකය) | නිවන් පතා පූජා කිරීම, පරිත්‍යාග කිරීම | පූජාවක් ලෙස හෝ අනුග්‍රහයක් වශයෙන් දෙන එමවස්තුව කෙරෙහි ලෝභය දුරු කර දීමෙන් සතුටුව නිවන් පිණිස වේවායි පතන කල්හි දාන පාරමිතාවයි. |
| 02 | ශීල පාරමිතාව (භූරිදත්ත ජාතකය) | නිවන් පතා කය, වචනය සංවර කිරීම | සම්බෝධිය පිණිස රක්නා වූ ශීලය කෙලෙස් වලින් කිලිටි නොවන සේ අඛණ්ඩව කුසල බලයෙන් පවත්වන ශීලය ශීල පාරමිතාව වේ. |
| 03 | නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව (මහා ජනක ජාතකය) | කම් සැප හා භවයන් කෙරෙන් වෙන් වීමේ කැමැත්ත | නුවනින් යුතුව කාමයන්ගේ සහ භවයන්ගේ ආදීනව දැක කාමයන් කෙරෙන් හා භවයන් කෙරෙන් නික්මෙන්න සිතේ ඇති කැමැත්ත (නිර්වාන අවබෝධය) |
| 04 | ප්‍රඥා පාරමිතාව (විදුර ජාතකය) | නිවන් පිණිස නුවණින් කුසල් රැස්කර ගැනීම | සම්බෝධිය පිණිස විදර්ශනා ඥානය දියුණු කර ගැනීමට දහම් ශ්‍රවණය, දේශනා කිරීම, තිලක්ෂණ මෙනෙහි කිරීම යනාදී ප්‍රඥාවෙන් කටයුතු කිරීම |
| 05 | වීර්‍ය පාරමිතාව (අපණ්ණක ජාතකය) | නිවන් දක්නා මොහොත දක්වා උත්සාහයෙන් කටයුතු කිරීම | නිවන් දැකීම පිණිස පවත්වන ආමිස, ප්‍රතිපත්ති අන්‍යයන්ට යහපත සිදු කිරීම ආදී නුවණින් යුක්තව කුසල් වැඩි වීමට කරන වීර්යය පාරමිතාවකි. |
| 06 | ක්ෂාන්ති පාරමිතාව (මහා කපි ජාතකය) | අකුසල කර්ම සිදු නොවන ලෙස ඉවසීමෙන් කටයුතු කිරීම | සම්බෝධියට පැමිණීම සඳහා, ඇතිවන සා-පිපාසා ලෙඩ රෝග ආදී දුක්ද, මනුෂ්‍ය තිරශ්චීන සත්වයන්ගෙන් වන පීඩා ආදිය ඉවසීම පාරමිතාවකි. |
| 07 | සත්‍ය පාරමිතාව (මහා සුතසෝම ජාතකය) | නිවන් පිණිස සත්‍ය රකිමියි කල කී දෑ ඒ ආකාරයෙන්ම කීම | අනුන් නොරැවටීම, පොරොන්දු කඩ නොකිරීම ආදියෙන් සත්‍යයෙහි පිහිටා නිවන් පිණිස සත්‍යය රකිමියි කටයුතු කිරීම සත්‍ය පාරමිතාවයි. |
| 08 | අධිෂ්ඨාන පාරමිතාව (තේමිය ජාතකය) | නිවන් පිණිස නුවණින් සිතූ පරිදි කිරීම හෝ නොකිරීම | සත් ක්‍රියාවන් සිදු කිරීමට සිතූ පරිදි එම දින වකවානු වලදී වෙනස් නොකොට නොඩුව සිතූ පරිදි කිරීම අධිෂ්ඨාන පාරමිතාවයි. |
| 09 | මෛත්‍රී පාරමිතාව (චුල්ල ධර්මපාල ජාතකය) | නිවන් පිණිස සියළුම සත්වයන් කෙරෙහි මිත්‍රත්වය පැවැත් වීම | සම්බෝධිය පිණිස සතුරු මිතුරු මැදහත් සැමදෙනා කෙරෙහි පවත්වන මිතුරු බව මෛත්‍රී පාරමිතාවයි. |
| 10 | උපේක්ෂා පාරමිතාව (ලෝමහංස ජාතකය) | නුවණින් යුක්තව අටලෝදහමේ කම්පා නොවීම | සම්බෝධිය පිණිස සියළු සත්ව සංකාරයන් කෙරෙහි මැදහත්ව සිතීම, කටයුතු කිරීම උපේක්ෂා පාරමිතාවයි. |

සැලකිය යුතුයි :-

ප්‍රාර්ථනා කරන බෝධියකින් නිර්වාණය අවබෝධය පිණිස අවශ්‍යම ගුණ ධර්ම දස පාරමිතා ධර්මයි.

එබැවින් නුවණින් පාරමී ගුණ ධර්ම පිරිය යුතුයි. කරන, කියන, සිතන සියළු යහපත් ක්‍රියාවන් නිවන් පිණිස හේතු වේවායි ප්‍රාර්ථනා කල යුතුයි.

ප්‍රාර්ථනා පිරීමට පිළිවෙලක් නැත. එක් පාරමිතාවක් පිරීමට කටයුතු කරන විට ඒ හා සම්බන්ධව තවත් පාරමී ගුණ ධර්ම වර්ධනය වේ.

ශ්‍රාවක බෝධියෙන් නිවන් ප්‍රාර්ථනා කරන්නා හට පාරමිතා (තමන් සතු වස්තු අපේක්ෂාවෙන් තොර) වශයෙන් පුරුදු කර ගැනීම ප්‍රමාණවත් වේ. පාරමිතා පුරණ කාලයක් ද සඳහන්ව නැත. නුවණින් යුක්ත තැනැත්තාට එක භවයක් තුල බොහෝ පාරමී පුහුණු විය හැක.

සිත් ඇති වීම ඉන්ද්‍රියන්ට ගැටෙන අරමුණු තුලින් බොහෝ විට සිදු වේ. ලෝකය තුල සවිඥානක, අවිඥානක සත්ව, පුද්ගල, වස්තු කෙරෙහි ඇලීම (ලෝභය) ගැටීම (ද්වේශය) තොරව සිතක් පැවැත්මට (උපේක්ෂා) මෙම පාරමී ගුණ ධර්ම වඩවා තිබූ ප්‍රමාණයට පහසුය. එබැනි සිතක් සමාධි ගතවීම (උද්දච්චය අඩු වීම) ප්‍රඥාව දියුණු වීමට බොහෝ කොට හේතු වේ. මෙය පාරමිතා ධර්ම වැඩීම තුල සිදුවන ප්‍රධාන ලක්ෂණයකි.

තමන් සතු වස්තුව පිළිබඳව නිරපේක්ෂව පාරමී පිරීම - පාරමිතා

තම ශරීරයේ අංගයන් පිළිබඳව නිරපේක්ෂව පාරමී පිරීම - උප පාරමිතා

තම ජීවිත පූජාවෙන් පාරමී පිරීම - පරමත්ත පාරමිතා වේ.

# දසපුණ්‍ය ක්‍රියා වස්තු

| | පුණ්‍ය ක්‍රියාව | අර්ථය | කෙටි විස්තරය |
|---|---|---|---|
| 1 | දානය | තමන් සතු වස්තුව අන් සත්ව, පුද්ගලයින්ගේ යහපත උදෙසා දීම. | 1.ආමිස දනය 2.අභය දනය 3.ධර්ම දනය වශයෙන් දානය ත්‍රිවිධ වේ. වස්තුන් දන් දීමෙන් එය කෙරෙහි ඇති ලෝභය දුරු වේ. ප්‍රාර්ථනාවෙන් තොර අනුරූප විපාක ලැබේ. නිර්වාණ ප්‍රාර්ථනය උතුම් වේ. |
| 2 | ශීලය | කය-වචනයෙන් තමන්ටත්, අන් සත්වයන්ටත් පීඩාවක් නොවන පරිදි සංවර වීම. | 1.පඤ්ච ශීලය 2.අෂ්ඨාංග ශීලය 3.නවාංග ශීලය 4.දස ශීලය 5.සාමණේර දස ශීලය 6.උපසම්පදා ශීලය ආරක්ෂා කර ගැනීම. |
| 3 | භාවනාව | සමාධිය හෝ ප්‍රඥාව දියුණු වන සුදුසු අරමුණක සිත මනා කොට හැසිරවීම. | 1.සමථ භාවනා (දස කසින ආදී) විසුරුණු සිත සමාධි ගත කිරීම.<br>2.විදර්ශනා භාවනා (ත්‍රිලක්ෂණාදී) ප්‍රඥාව දයුණු කිරීමට භාවනා කිරීම. |
| 4 | අපචායන | පිදිය යුතු උතුමන් පිදීම. | පිදිය යුතු උතුමන් ඇති නැති තැන.<br>1.කයෙන් වන්දනා කිරීම.<br>2.ස්තුති කිරීම (ස්තුති ගාථා කීම.)<br>3.ගුණ මෙනෙහි කිරීම පිංකමකි. |
| 5 | වෙයාාවච්ච | පිදිය යුතු උතුමන්ට හා පූජනීය වස්තුන්ට වත්පිළිවෙත් කිරීම. | තුරුණුවන්ට, මව්පිය, ගරු උතුමන්ට හා චෛත්‍ය, බෝමළු, විහාර මන්දිර, පූජනීය භූමිහි පිළිවෙත් සිදු කිරීම පිංකමකි. |
| 6 | ප්‍රාප්තිදනය | තමන් විසින් කරගත් පිංකම්, පිං බලාපොරොත්තුව සිටින අයගේ යහපත පිණිස අනුමෝදන් කිරීම | දෙවියන්ට, මළගිය ඥාතීන්ට, සියළු සත්වයන්ට හා ජීවත්ව සිටන අයට වුවද අප මෙවැනි පිංකමක් කලා ඔබත් ඒ ගැන සතුටු වන්නයි කියා අනුමෝදන් කිරීම පිංකමකි. |
| 7 | පත්තානුමෝදනය | තවත් අයකු කරන පිංකම් දක අසා සිත සතුටු කර ගැනීම. | යමෙකු කළ පිංකමක් ගැන අසා දක ඒ ගැන සිත පහද ගැනීම. |
| 8 | ධර්ම ශ්‍රවනය | ලෝකයේ සත්‍යාවබෝධය පිණිස දහම් ඇසීම | සිත,කය,වචනයෙන් කල යුත්ත නොකල යුත්ත දූන වැරදි මගහරවා ගනිමින් නිර්වාණ මාර්ගයේ ගමන් කිරීම පිණිස දහම් ශ්‍රවනය. මහා පිංකමකි. |
| 9 | ධර්ම දේශනය | ලාභ,කීර්ති,ප්‍රශංසා ආදී බලාපොරොත්තු රහිතව කරුණා-මෛත්‍රී සිතින් දහම් දෙසීම හෝ දේශනා කරවීම. | ධර්ම දේශනා කිරීම, කරවීම, දහම් පොත් පත් ආදිය මුද්‍රණය කරවීම ධර්ම දේශනා පිංකමකි. |
| 10 | දිට්ඨිජුකම්මය | බුදු රජාණන් වහන්සේගේ ධර්මය පිළිබඳ නිවැරදි වැටහීමක් ඇති කර ගැනීම. (සම්‍යක් දෘෂ්ඨිය) | කර්මය, කර්ම ඵලය, පටිච්ච සමුප්පාදය, චතුරාර්ය සත්‍යය, සත්තිස්බෝධිපාක්ෂික ධර්ම ආදියෙහි සැක හැරදූන ගැනීම පිංකමකි. |

සැළකිය යුතු කරුණු :-
පුණ්‍ය කර්ම මනා අවබෝධයෙන් කිරීමෙන් (මෝහය දුරු වීමෙන්) බලවත් වේ
දන පිංකම් (ආමිස) ප්‍රබල වීමට නම්, වස්තුව ධාර්මිකව උපයාගෙන තිබීම, ප්‍රතිග්‍රාහක පක්‍ෂය සිල්වත් වීම, තමන්ගේ සිල්වත් භාවය, පූජා කිරීමට පෙර, පූජා කරන අවස්ථාව, පූජා කිරීමෙන් පසු ඇති වන සතුට හා කර්මය කර්ම ඵල විශ්වාසය යන අංගයන් සම්පූර්ණ විය යුතුයි
පුණ්‍ය කර්ම විපාක ප්‍රාර්ථනාවෙන් තොරව සසර ගමන සැප ලැබීමත් පිංකම නිවන් ප්‍රාර්ථනා කරගනිමින් කිරීමෙන් සැප විපාක ලබමින් නිර්වාණය අවබෝධයට හේතුවන කුසල කර්ම වේ.

දස පුණ්‍යකර්මයෝම කරගත හැකි පිංකම් :- පිරිත් පිංකම්, සාංඝික දන පිංකම්, ගිලන් පස බෝධි පූජා පිංකම්.

# ආර්ය අෂ්ඨාංගික මාර්ගීය

ආර්ය අෂ්ඨාංගික මාර්ගීය

| | | මාර්ග අංග | අර්ථය/චෛතසිකය | සම්පූර්ණ විය යුතු කරුණු |
|---|---|---|---|---|
| පඤ්ඤා | 1 | සම්‍යක් දෘෂ්ඨිය<br>02 | නිවැරදි දැකීම<br>(අමෝහ/ප්‍රඥා චෛතසිකය) | 1 දශ වස්තුවක සම්‍යක් දෘෂ්ඨිය<br>2 චතුස්සත්‍ය සම්‍යක් දෘෂ්ඨිය<br>යන දෙකින් දෙවන සම්‍යක් දෘෂ්ඨිය ඇති කර ගැනීම ප්‍රධාන වේ |
| | 2 | සම්‍යක් සංකප්ප<br>03 | යහපත් සංකල්පනාව<br>(විතර්ක චෛතසිකය) | 1 නෛෂ්ම්‍යය (පඤ්ච කාමයන්ගෙන් මිදීමට සිතීම)<br>2 අව්‍යාපාද 3 අවිහිංසා<br>යන සංකල්පනා ඇති කරගැනීම |
| ශීල | 3 | සම්‍යක් වචන<br>04 | අයහපත් වචනයෙන් වැළකීම<br>(විරති චෛතසිකය) | 1 මුසාවාද 2 පිසුනාවාචා<br>3 පරුසාවාචා 4 සම්ප්‍රළාප<br>යන මේවා කීමෙන් වැළකී සිටීම |
| | 4 | සම්‍යක් කර්මාන්ත<br>03 | අයහපත් කායකම් වලින් වැළකීම<br>(විරති චෛතසිකය) | 1 ප්‍රාණඝාතය 2 අදත්තාදනය<br>3 කාමයෙහි වරදවා හැසිරීම<br>යන මෙම ක්‍රියාවන්ගෙන් වැළකීම |
| | 5 | සම්‍යක් ආජීවය<br>05 | අයහපත් දිවිපැවැත්මෙන් වැළකීම<br>(විරති චෛතසිකය) | 1 ආයුධ වෙළඳම 2 වහල් වෙළඳම<br>3 මස් වෙළඳම 4 මත්පැන්වෙළඳම<br>5 විෂ වෙළඳම ආදියෙන් ජීවත් නොවීම |
| සමාධි | 6 | සම්‍යක් ව්‍යායාමය<br>04 | යහපත් උත්සාහය<br>(වීර්‍ය චෛතසිකය) | 1 උපන් අකුසල් දුරු කිරීම<br>2 නූපන් අකුසල් නූපදීමට<br>3 උපන් කුසල් දියුණුකිරීමට<br>4 නූපන් කුසල් උපදවා ගැනීමට උත්සාහ කිරීම |
| | 7 | සම්‍යක් සතිය<br>04 | යහපත් සිහිය<br>(සති චෛතසිකය) | 1 කාය 2 වේදනා 3 චිත්ත 4 ධම්ම<br>යන අරමුණු තුළ සිහිය මනා කොට පැවැත්වීම (සතර සතිපට්ඨානය) |
| | 8 | සම්‍යක් සමාධිය<br>04 | යහපත් එකඟ බව<br>(ඒකාග්‍රතා චෛතසිකය) | 1 ප්‍රථම ධ්‍යාන 2 ද්විතිය ධ්‍යාන<br>3 තෘතීය ධ්‍යාන 4 චතුර්ථ ධ්‍යාන<br>යන්නෙහි සමාධිය එකඟ බව<br>(අභිධර්ම දේශනාවට අනුව ධ්‍යාන5කි) |

* ශීල, සමාධි, ප්‍රඥා, ලෙස ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය හැඳින්වූවත් සටහන් වීමේදී ප්‍රඥාව මුලට යෙදෙන්නේ එහි සම්‍යක් දෘෂ්ඨිය දියුණු වීම අනෙක් චෛතසික ධර්මයන්ගේ දියුණුවට උපකාරයෙන් දියුණු වන බැවිනි. ඒවා වැඩෙන්නේ චක්‍රයක් ලෙසට එකිනෙක සහාය වීමෙනි.
* ප්‍රඥාවන්තයෙකුට සිල් රැකීම පහසුය. එම නිසා සිතේ සමාධිය ඇති වේ. සමාධි සිත තව තවත් ප්‍රඥාව දියුණු වීමට උපකාර වේ. මෙසේ සීල නිසා සමාධියත් සමාධිය නිසා ප්‍රඥාවත් ඔවුනොවුන් බලවත්ව වැඩේ.
* පංච ශීලය රකින්නා විශේෂ දිනයන්හි දී අට සිල්, නව සිල්, දස සිල් රැකීමෙක් පංච ශීලය රැකීමට මහත් බලයක් වේ.
* ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයේ 'සම්‍යක් කර්මාන්ත' පංච ශීලය රකින්නෙකු අතින් ආරක්ෂා වන අතර අනෙක් මාර්ග අංග වැඩීමටත් උපකාරී වේ. එම නිසා පංච ශීලය රකින ගිහි සැප විඳින පිංවතුන්ට පවා මාර්ග ඵල අවබෝධ කර ගත හැක.
* ආර්‍ය අෂ්ඨාංගික මාර්ගයේ (මධ්‍යම ප්‍රතිපදාව) විරති චෛතසික තුනෙන් එකක් පමණක් එක් සිතක පහල වේ. අනෙක් චෛතසික 4,5,6, වශයෙන් එක් සිතක ඇති වුවත් මාර්ගස්ථ සිතේ විරති තුනම හා අනෙක් සියළු චෛතසික පහල වේ.
* මෙම සියල්ල පළමු වර සිතේ පහල වීම (චිත්ත විථි) සෝවාන් මාර්ග ඵල, 2 වන වර, 3 වන වර, 4 වන වර ආදී කෙදිනක හෝ මෙම චෛතසික ධර්ම සමග චිත්ත විථි ඇතිවීම සකෘදගාමී, අනාගාමී, අර්හත් මාර්ග ඵලයන්ට පත් වීමයි. දුක් කෙළවර කිරීමයි.

සමථ භාවනා මගින් (විදර්ශනාවට ඕනෑම ධ්‍යානයකට සිට යොමුවිය හැක.)

උපචාර (ධ්‍යානයන්ට ආසන්න සිත) 1 වන ධ්‍යාන (අපර්ණා), 2 වන ධ්‍යාන, 3 වන ධ්‍යාන, 4 වන ධ්‍යාන
1----5 2----5 3----5 4----5

5 වන ධ්‍යාන
4-----5
→ අරූප ධ්‍යාන වැඩීම කළ හැක.
→ අභිඥා ඉපදවීම කළ හැක.

විදර්ශනා භාවනා මගින් උපචාර (ධ්‍යානයන්ට ආසන්න සිත)
1 වන ධ්‍යාන (අපර්ණා), සෝවාන්, සකෘදගාමී, අනාගාමී, අර්හත්මාර්ග ඵලයන්ට පත්වීමයි.
1---5 1---5 1---5 1---5 1---5

ධයානය අංග චෛතසික

| විතක්ක | විචාර | ප්‍රීති | සුඛ / උපේක්ෂා | ඒකාග්‍රතා |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4<br>වේදනා චෛතසිකය | 5 |

මෙත් සවිය
ශ්‍රී විජයාරාමය, ෆෙඩ්‍රිකා පාර, කොළඹ - 06 දු.ක: 0714 014467
දුක/ෆැක්ස්: 011 2505088 වෙබ් අඩවිය: www.methsaviya.org
මෙත් සවිය

# දස අකුසල

| | අකුසලය | හේතුව | සම්පූර්ණ විය යුතු කරුණු |
|---|---|---|---|
| ක | පාණාතිපාතා | පර පණ නැසීම. | 1. පණ ඇති සතෙකු වීම.<br>2. පණ ඇති සතෙකු බව දැන ගැනීම.<br>3. මරණු කැමති සිත.<br>4. මරන්නට උපක්‍රම කිරීම.<br>5. එම උපක්‍රමයෙන් මැරීම. |
| ය | අදත්තාදානය | තමන් සතු නොවූ දෑ සොර සිතින් ගැනීම. | 1. අන් සතු වස්තුවක් වීම.<br>2. අන් සතු වස්තුවක් බව දැන ගැනීම.<br>3. පැහැර ගනු කැමති සිත.<br>4. පැහැර ගැනීමට උපක්‍රම කිරීම.<br>5. එම උපක්‍රමයෙන් පැහැර ගැනීම. |
| ය | කාම මිථ්‍යාචාරය | අන් කෙනෙකු යටතේ යැපෙන රැකෙන ස්ත්‍රියක හෝ පුරුෂයකු සමග සංවාසයේ යෙදීම. | 1. සේවනය නොකළ යුතු ස්ත්‍රියක හෝ පුරුෂයෙකු වීම.<br>2. සේවන චිත්තයක් ඇති වීම.<br>3. සේවනයට උත්සාහ කිරීම.<br>4. සේවන ආශ්වාදය ලැබීම. |
| ව | මුසාවාදය | අසත්‍ය ප්‍රකාශ හෝ ඇඟවීම් කිරීම. | 1. කියන කරුණ බොරුවක් වීම.<br>2. අනුන් රවටන අදහස.<br>3. ඇඟවීමට උත්සාහ කිරීම.<br>4. අනෙකා එයින් රැවටීම. |
| ච | පිශුනාවාචය | දෙදෙනෙක් අතර හෝ පිරිසක් අතර අසමගිය ඇති කරන වචන. | 1. භේද කළයුතු කෙනෙක් සිටීම.<br>2. කෙනෙකු හා බිඳවන අදහස.<br>3. බිඳවීම පිණිස යමක් කිරීම.<br>4. එය ඇසූ තැනැත්තා එය විශ්වාස කිරීම. |
| න | පරුෂ වචනය | අන්‍යයන් ප්‍රිය නොකරන වචන භාවිතය. | 1. ආක්‍රොශ කරන්න පුද්ගලයෙකු සිටීම.<br>2. ආක්‍රොශ සහගත සිත් ඇති වීම.<br>3. ඔවුන්ගේ සිත් රිදවන වචන කීම. |
| ය | සම්ඵප්‍රලාපය | කියන-අසන දෙපක්ෂයට ප්‍රයෝජන නැති වචන. | 1. අසන හා කියන අයට ප්‍රයෝජනයක් නැති කථාවක් කියන අදහස.<br>2. එබඳු කථාවක් කීම. |
| සි | අභිධ්‍යාව | අන් සතු වස්තු තමන් සතු කර ගැනීමේ දැඩි ආශාව. | 1. අන් සතු වස්තුවක් වීම.<br>2. එය තමන් සතු කර ගැනීමේ දැඩි ආශාව. |
| ත | ව්‍යාපාදය | අන් සතු වස්තුව තමා සතු වීම සඳහා හෝ තමන් හා විරුද්ධයන් විනාශ වීමේ කැමැත්ත. | 1. අන්‍ය සත්වයෙකු හෝ පුද්ගලයෙකු වීම.<br>2. ඔවුන් විනාශ කිරීමට සිතීම හෝ විනාශය කැමති වීම. |
| ය | මිථ්‍යාදෘෂ්ඨිය | කර්මය, කර්ම ඵලය තෙරුවන් හා නිවන් මග කෙරෙහි වැරදි මත. | 1. යම් දෘෂ්ඨියක් වැරදි ආකාරයෙන් ගැනීම.<br>2. එයම සත්‍ය යැයි නිශ්චය කර ගැනීම. |

සැළකිය යුතු කරුණු :-
කුසලාකුශල කර්මයන් වර්තමාන භවයටත් මරණින් මතු භවයටත් හා නිවන් දක්නා භවය තෙක් විපාක දේ.
අංග සම්පූර්ණ අකුසල කර්මයකින් සතර අපා උප්පත්තිය හෝ උපන් ආත්ම භවයන්ට අනිෂ්ඨ ප්‍රති විපාක හෝ ගෙන දේ.
ආනන්තරීය පාප කර්ම හැර අන් අකුසල කර්ම, කුසල කර්ම මගින් යටපත් කිරීම කළ හැක.

අභිධර්මයට අනුව :- ජවන සිත් 1/23456/7
1. දිට්ඨ ධම්ම වේදනීය (වර්තමාන භවය)
2-6. අපරාපරිය වේදනීය (තුන්වන භවයේ සිට නිවන් දක්නා වූ භවය)
7. උප්පජ්ජ වේදනීය (අනාගත භවය)

බුදු දහම හා සමාජ විද්‍යාවට මහත් සේවයක් ඉටු කල අභාවප්‍රාප්ත
මහාචාර්ය නන්දසේන රත්නපාල මහතාගේ

# මේ ජීවිතයේ දීම පල දෙන කර්මය

(දිට්ඨ ධම්ම වේදනීය කර්මය)

කෘතිය හා ලිපි ඇසුරෙන් පහත සටහන ඔබ වෙත ඉදිරිපත් කරන්නෙමු.

**පාප ක්‍රියා කිරීමේ භයානක කම වටහා ගනිත්වා!**
**කල ආකාරයටම ප්‍රතිඵලය ලබා දීම කර්මයේ ස්වභාවයයි.**

## හරකුන් හා ලිංගික සබඳකම් පැවැත් වූ මිනිහා

මරන්න නියම සතුන් ඉන්නා හරක් ගාලෙන් එක් මිනිහෙක් හොඳ එළදෙනක හෝ නැම්බියක දුටු වහාම ගෙදර ගෙන ගියේය. උගේ මරණය ඒ නිසා ප්‍රමාද විය. මේ අතරතුර අවිවාහකයෙකු වූ ඔහු මේ එළදෙන සමග අස්වාභාවික සම්බන්ධයක යෙදුණේය. දින කිහිපයකට පසු ඒ එළදෙන හෝ නැම්බිය මරණයට පත් කෙරේ. උන්ගේ ලිංගික ප්‍රදේශය කපා ගෙනවිත් බුදීමට හෙතෙම ඉමහත් ආශාවක් දැක්වීය.

වරක් එළදෙනක ගෙවිත් ඌට ලිංගික අතවර කරන්නට සදන විට ඌ මිනිහාට බිම දමා ඇන්නේය. ඔහුට මේ විදිහට සැලකුවේ ඌ පමණි. තුවාල වූ මිනිහා ආරෝග්‍ය ශාලාවට ගොස් ආපසු පැමිණ ඒ එළදෙන කණුවක බැඳ ලිංගික ප්‍රදේශය තුවාල කළේය. පිහියෙන් එතැනට ඇන්නේය. තමාට කළ ක්‍රියාවට ඔහු පළිගත්තේ මේ රුදුරු විලාසයෙනි.

කුඩා වැස්සියන් ගෙනවිත් උන් හා සමගද මෙසේ සමාගමෙහි යෙදීමට ඔහු ආශා කළේය. වරක් ගෙනා නැම්බියක් මාස ගණනක් තමා ළඟ තබා ගත් ඔහු ඌට පුදුම ආශාවක් දැක්වීය. උගේ මරණය පවා කල්දමා ඉමහත් ආදරයෙන් ඌට සැළකීය. නමුත් අවසානයේදී ඌට සිදුවූයේ අනිත් හරකුන් විලසම මරණයට යෑමය.

කලක් යෑමෙන් පසු ඒ මිනිසාගේ ලිංගික අවයව වල ලෙඩක් හටගත්තේය. ගමේ වෛද්‍යවරයාගෙන් බේත් ගත්තත් සුවයක් නැති නිසා ඔහු ආරෝග්‍යශාලාවට යවන ලදී. ලිංගික රෝග අංශයෙන් ඔහුට කල ප්‍රතිකාර වලින් වැඩක් නොවීය. ඔහුගේ ලිංගික අවයව වල ගෙඩි ඇවිත් තුවාල සෑදී කළු වෙමින් තිබිණ. එය කපා දැමිය යුතු බව වෛද්‍යවරුන් කීහ.

කරන්නට දෙයක් නැති නිසා අවසානයේ දී හෙතෙම ඊට එකඟ විය. නමුත් කපා දැමුවත් ඉතිරි කොටස යළිත් කළු වෙන්නට පටන් ගත්තේය. ඒ කොටස යළිත් පැසවන්නට විය. හෙතෙම මේ නිසා මහත් දුක් විඳ කෙඳිරි ගාමින් කාලය ගත කළේය. කලක් යන විට මරණය ළඟා වියී

## හරක් පැටවු මැරූ මිනිසා

එක් ගොන් ඝාතකයෙක් පුරුදුව සිටියේ වැඩුණු හරක් මරණ අතරම හරක් පැටවි කීප දෙනෙක් ඒ අතර ගෙනවිත් උන් මැරීමය. අවුරුදු ගණනක් හෙතෙම මෙය කර ගෙන ගියේය. හරක් පැටවුන්ගේ මස් කෑමට ඔහු තදින් ආශා කළේය. වසු පැටවකුගේ මස් නැතිව එක් වේලක්වත් ආහාර බුදීම ඔහුට කළ නොහැකි විය. සමහර දවස් වලට ඔහු මැරූ හරක් පැටවුන්ගේ මස් නගරයේ කඩවල විකුනුනේ එළු මස් ලෙසය.

ගම් වලට ගොස් උපායෙන් ගැමියන් රවටා ලබා ගන්නා හරක් පැටවි තමාගේ ගේ අවට ගාල්වල බඳියි. එතැන දී උන්ට අනේක ප්‍රකාර වද දීම ඔහු ප්‍රිය වෙයි. ගොන් ඝාතකාගාරයට උන් දක්කාගෙන යන්නේ එතැන සිටය. පැටවුන්, එළදෙනුන්ගෙන් ඈත් කොට බැඳ, උන් කෑගසන විට ඔහු ඒ සතුන්ට පහර දෙයි. එසේ පහර දීමට හීන් කෝටු සාදාගෙන තිබේ. හරකුන්ගේ හා පැටවුන්ගේ හම පිපිරී ලේ ගැලුවත් ඒ ගැන ඔහුට මොනම අනුකම්පාවක්වත් නැත.

දිනක් හෙතෙම පැටවුන් දෙදෙනෙකු හා එළදෙනක ගෙන ආවේය. උන් තුන්දෙනා ආහාර නොදී තබන ලදී. පැටවු බඩගින්නේ කෑගසන්නට විය. ඔවුන් එසේ කෑගැසුවේ සමහර විට තමන්ටත් මේ විපත්තියක් සිදුවන බව ඉවෙන් මෙන් දැනගෙන වන්නට ඇත. පැටවු පණ පිටින්ම ගින්නේ පිළිස්සුවේය. එසේ පිළිස්සූ පැටවුන්ගේ මස් ඔහු ආශාවෙන් අනුභව කළේය. එදාම ගෙදර කුස්සියේ භූමිතෙල් ලාම්පුව පෙරළී ඝාතකයාගේ කුඩා දරුවා ගින්නෙන් පිළිස්සී මරණයට පත් විය. ඒ දරුවා හනික ආරෝග්‍යශාලාවකට ගෙන ගියත් රුදුරු මරණයෙන් බේරා ගත නොහැකි විය.

ඊළඟ අවුරුද්දේ ඔහුගේ බිරිඳ දරුවකු ප්‍රසූත කළාය. ඒ දරුවාගේ සකල ශරීරය ද පිළිස්සී ගියා මෙන් කාලවර්ණ විය. ඒ සඳහා මොන පිළියම් කළත්, වතාවත් කලත් වැඩක් වූයේ නැත. කුඩා දරුවා ඉපිද සති කිහිපයකින් වලිප්පුව සෑදී මිය ගියේය.

තුන් වැනි දරුවා බිහිකළ විට ඒ දරුවාගේ කකුල් දෙක පිහිටියේ වසු පැටවකුගේ ගාත් ලෙසය. හෙතෙම මේ ගැන බලවත් වේදනාවෙන් සිටියේය. දරුවා ද ටික දිනකින් මරණයට පත් වූයේ හිටි හැටියේය. එක් අතකින් ඒ දරුවා නිසා තමන්ට මහත් ලැජ්ජාවක් වෙතියි සිතූ ඔහුට දරුවාගේ මරණය තරමක සැනසිල්ලක් විය.

ඉන් පසු ඔහුට දරුවන් ලැබුනේ නැත. නෑ පවුලකින් දරුවකු ඉල්ලා හදාගත් අතර ඒ දරුවාට හෙතෙම මහත් සේ ආදරය කළේය. දරුවා ලොකු මහත් වූ විට හරක් මරන තැනට ඔහුව ගෙන ගියේය. තාත්තා කරන සේ කරන්නට දරුවාටද පුරුදු කළේය.

දරුවා ද "තාත්තා" මෙන් හරකුන් පසු පස යමින් උන්ට තලයි. ඔහුද "තාත්තා" මෙන් හරක් මසට ප්‍රිය කළේය.
"තාත්තාගේ" ක්‍රියා අනුගමනය කළ ඔහු බිම කණුවක බැන්ද හරකුන්ගේ උගුරු දණ්ඩ කපන්නට පුරුදු විය. කුඩා වසු පැටවුන් ද මේ ආකාරයට මරණයට පත් කළේය. අවුරුදු ගණනක්ම මේ කටයුත්ත කළ ඔහු යාතු කර්මක් ලෙස උන්ගේ උගුරු දණ්ඩ කපන හැටි උගත්තේය.

කලකට පසු දරුවා ගෙදරින් අතුරුදහන් විය. හෙතෙම ඔහු සොයන්නට මහත් වෙහෙසක් ගත්තේය. යාතුකර්ම කිරීම හා පූජා කර්ම කළේය. ළඟපාත මිනිසුන් කියන නිසා තමා නොඇදහුවත් මන්ත්‍ර පූජා විදි කළේය.

සතියකට පමණ පසු දරුවාගේ මළසිරුර අසල තිබූ කැලෑවකින් හමු විය. එය කැලෑ නරින් විසින් හපා තිබිණ. විශේෂයෙන්ම උගුරු දණ්ඩ හා බෙල්ල කා දමා තිබිණ. ඔහුට මේ විපත්තිය සිදුවූයේ කෙසේදැයි කවුරුත් නොදත්හ. තමාගේ පුතාට අතවර කරන්නට තරම් තරහකාරයෙක් නැතැයි ඔහු කීවේය. මරණය සිදු වූයේ කෙසේදැයි හරි හැටි දැනගැනීමට මරණ පර්යේෂණයේදීවත් නොහැකි විය. දරුවා කැලෑවේ සිහිසුන්ව වැටී සිටිය දී මෙසේ සතුන් විසින් කා දමන ලද බව පමණක් කියැවිණි. ඔහුට සිහිසන් නැති වූයේ කෙසේද? ඒ ප්‍රශ්නයට උත්තර සොයා ගත නොහැකි විය. හරක් පැටවුන් මරණ මිනිසා ඉමහත් දුක් විඳ ඊට මසකට පසු ඇඟ පුරා තුවාල සෑදී මරණයට පත් විය.

## දොළ දුකට හරක් පැටවා තම්බා බිරිඳට කැවූ මිනිහා

ඔහු සිංහල මිනිසෙකි. ඔහුගේ බිරිඳට පුදුම දොළදුකක් විය. තමන්ගේ මිනිහා හරක් මරුවෙක් වූවත් ඕ මේ පුදුම දොළදුක ගැන ඔහුට නොකීවාය. දිනෙන් දින කෘශ වූ ඇය දෙස බලා සිටි මිනිසා පෙරැත්ත කරමින් ඇගෙන් ඊට හේතු විමසීය. තමාට ගැබක් පහළ වූ බවත් ඒ මුල් කරගෙන විශාල දොළදුකක් ඇති බවත් ඕ බැරිම තැන ඔහුට කීවාය. එළදෙනකට මුලින්ම ලැබෙන පැටවා තම්බා කෑම මේ දොළදුකය. ඇය ඒ ගැන කියන්නට පවා මුලින් අකමැති වූවත්, "ඕක ඔච්චර අමාරු වැඩක් නොවෙයි. මම කර දෙන්නම්, " ඔහු උත්තර දුන්නේය.

12 වන පිටුවට.....

...11 වන පිටුවෙන්

ඔහු ගම්වලට හරකුන් මිලයට ගන්නට ගිය විට පැටවකු හම්බ නොවූ එළදෙනක සොයන්නට මහන්සි විය. වරක් එවැනි එළදෙනක ඔහුට හමු විය. ඌ මිලට ගෙන ආ ඔහු තම නිවසේ තාවකාලික හරක් ගාලක් තනා ඌ තබා ගත්තේය. ඌට කන්න බොන්න හොඳින් දුන්නේය.

කීප දවසකට පසු ඔහු මරන්නට ගෙනා ගොන් නාම්බෙකු එම ගාලේම බැන්දේය. එළදෙනට පැටියෙක් හට ගත්තේය. ඒ බව දැනගත් විට ඔහු, නාම්බා ගෙන ගොස්, මරණයට කැප කළේය.

එළදෙන විවිධ සැප විඳිමින් වැජඹෙන්නීය. මසකට පමණ පසු උගේ බඩේ පැටවා ඇති වූ බව දැනගත්තේය. මාස දෙක තුනකට පස්සේ ඌ මරා බඩ කපා පැටියා එළියට ගත් ඔහු පැටියා එහෙම පිටින් හැළියක ලා තැම්බුවේය. එසේ තම්බා තම බිරිඳගේ දොළදුකට උගේ මස් කෑමට දුන්නේය.

මුට්ටියේ වතුර ලිප මත තබන්නට උදව් වූයේ බිරිඳය. පැටියා ඒ විශාල වළඳ තුළට දමාලූයේ දෙකට තුනට නමාය. උගේ මස් තැම්බෙන විට කෙළ පෙරෙමින් සිටි බිරිඳ සිත්සේ ඒවා අනුභව කළාය.

කලකට පසු බිරිඳට දරුවා ලැබෙන්නට ළංවිය. ඔහු ඇයත් සමග සමීපයෙන් පිහිටි දේවාලයකට ගියේය. එය ඉතා අනුහස් ඇතැයි මිනිසුන්ගේ විශ්වාසය විය. දරුවා ලැබුනොත් රනින් කළ පිළිමයක් දෙවියන්ට පූජා කරන්නට හේ සපථ විය.

දේවාලයට යන ගමනේ දී කිලිවලට අසු නොවන්නට ඔවුහු පරිස්සම් වූහ. දෙදෙනා ස්නානය කොට පිරුවට ඇඳ පූජා භාණ්ඩත් රැගෙන ඔවුහු දේවාලයට ආහ. ඒ දවසේ හරක් නොමරා සිටින්නට ඔහු වගබලා ගත්තේය.

දේවාලයට ගොස් ආපසු එන ගමනේ ඔවුන්ගේ මෝටෝරිය ගසක ගැටිණ. රියදුරා පැන ගත්තත් මොන කරුමයක් නිසා හෝ ඒ මිනිහා හා ගැහැණියට ඉවතට ගත නොහැකි විය. වහවහා බුරබුරා නැගෙන ගිනිදැල් දෙදෙනාගේ සිරුරු සිපගත්තේ, ඉතා ඉක්මනින්ය. ගින්න නිවන විට දෙදෙනාම පිළිස්සී අවසානය. ඒ ගින්න සමග කුසේ සිටි දරු පැටවා ද ගිනිබත් විය.

## සමස්ථ ලංකා ඒකාබද්ධ අවිහිංසා සම්මෙලනයේ සභාපති ධූරයට මෙත්සව්ය සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා පත් කර ගනී.

ගරු සංස්කෘතික ඇමතිතුමාගේ මූලිකත්වයෙන් හා අති පූජ්‍ය අහංගම ආනන්ද හිමි හා හාරිස්පත්තුවේ අරියවංශාලංකාර හිමියන්ගේ අනුශාසණත්වයෙන් පසුගිය 2008 සැප්තැම්බර් මස දී ලංකාව තුල සත්ව අවිහිංසන ක්‍රියා කරන සියළු සංගම් වල එකතුවකින් පොදු හඬක් නැගීම පිණිස ඒකාබද්ධ සංගමයක් පිහිටුවා ඇත. මෙහි සභාපති ධූරයට අප සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා පත් කර තිබීම සතුටට කරුණකි. නීති විරෝධී ලෙස ප්‍රවාහනය කරන හරකුන් විශාල ප්‍රමාණයක් ගරු අයිරාංගනී ද සිල්වා (අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ බිරිඳ) මැතිණියගේ වෑයමෙන් උසාවි වලට ඉදිරිපත් වී වරදකරුවන්ට දඬුවම් පමුණුවා නිදහස් කර ගෙන ඇත. පවතින නීති වල අඩුපාඩු සකසා දෙන ලෙස 'මෙත්සව්ය' මගින් අතිගරු ජනාධිපති තුමන් වෙත පසු ගිය දා භාර දුන් අත්සන් ලක්‍ෂයකින් යුතු ආයාචනයට ද යහපත් ප්‍රතිචාරයක් ලැබීම මෙත් සිත් පෙර දැරිව බුදු දහම පිළිපදිනා බහුතරයක් වූ බෞද්ධ ජනතාවගේ සිත් පහන් වීමට හේතු වී ඇත. මේ අතර අප අනුශාසක අහංගම ආනන්ද ස්වාමීන්ද්‍රයන් වහන්සේට ඔරුගොඩ වත්ත මස් මඩුවේ දී මරණයෙන් ගලවා ගත් ගවයෙකු වඳින දර්ශනය ප්‍රසිද්ධියට පත් වී ඇති අතර, මින් ගවමසින් වැළකීමට බොහෝ දෙනා යොමු වී ඇත.

## සිතේ ආයුෂ කොපමණ වේ ද ?

අහසේ හට ගන්නා විදුලිය සැණෙකින් කිසිවක් ඉතිරි නොවී නැතිවන්නාක් මෙන් ද, බෙරයකින් නිකුත් වන හඬ සැණෙකින් කිසිවක් ඉතිරි නොවී නැති වන්නාක් මෙන් ද, කර අවසන් වනු සමඟම සිදු වී අවසන් වනු සමඟම එයින් කිසිවක් ඉතුරු නොවී ක්‍රියා අභවප්‍රාප්ත වේ. සිත ද ක්‍රියාවක් බැවින් ක්‍රියාවන්ට අයත් වූ ඒ ස්වභාවය ඉක්මවා ඉපද මොහොතකුදු නො පැවතී වහා අභවප්‍රාප්ත වේ. පරමාර්ථ ධර්මයන්ගේ ඒ අභාවප්‍රාප්තියට නිරෝධය යි ද භංගය යි ද කියනු ලැබේ. එක් සිතකට උපදනා කාලයය, පවත්නා කාලයය, බිඳෙන කාලයය යි කාල තුනක් ඇත්තේය. ඒ තුන් කාලය ප්‍රමාණයෙන් සමය. එකක් වත් දිගින් අඩු වැඩි කමක් නැත. උපදින්නට යම් පමණ කාලයක් වේ නම් එපමණ කාලයක් පැවතී එපමණ කාලයකින් බිඳී යාම චිත්ත චෛතසික පරමාර්ථ ධර්මයන්ගේ ස්වභාවය ය. රූප පරමාර්ථයන්ගේ ජීවන කාලය සිත මෙන් සතළොස් ගුණයකි. සිතේ ඉපදීමට උත්පාදය යි ද, පැවැත්වීමට ස්ථිතිය යි ද, අභාවප්‍රාප්තියට භංගය යි ද කියනු ලැබේ. උත්පාදස්ථිති භංග යන මේ තුන් කාලයට චිත්තක්‍ෂණය යි කියනු ලැබේ. චිත්තක්‍ෂණය ඉතා ලුහුඬු කාලයකි. එක් සන්තානයක එක් සිත් පරම්පරාවක එකවර සිත් දෙකක් නූපදින්නේය. දෙවන සිතක් උපදිනනේ උපන් සිත සම්පූර්ණයෙන් අභවප්‍රාප්ත වූ පසුය. සාමාන්‍ය ලෝකයා විසින් ඉතා කෙටි සැටියට සලකන්නේ අසුරක් ගැසීමට ගත වන කාලය හා ඇසිපිය හෙළීමට ගත වන කාලය යි. "සො පණ ඛණො අච්ඡරාසංඝාත ඛණස්ස අක්ඛිනිම්මීලන ඛණස්ස ච අනෙකකොටි සතසහස්ස භාගො දට්ඨබ්බො" යනුවෙන් සිතක ජීවන කාලය, අසුරු ගසන කාලයෙන් ඇසිපිය හෙළන කාලයෙන් කෝටි ලක්‍ෂ ගණනකින් කොටසක් තරමට කුඩා බව දක්වා තිබේ.

උපන් සිත කෙතරම් ඉක්මනින් කොතෙක් වේගයෙන් නිරුද්ධ වෙතත් තැන සිස් නොවන ලෙස නිරුද්ධ වන සිත හා බැඳී උපදින සේ අලුත් අලුත් සිත් එළඹ සිටින අනේකප්‍රකාර ආරම්මණයන් ගනිමින් උපදින්නේ ය. නිරෝධසමාපත්ති අවස්ථාව හා අසංඥභූමියේ ඉපද සිටින අවස්ථාවන් හැර චිත්ත පරම්පරාවේ සිත් නූපදනා අවස්ථාවක් නැත. විශේෂාරම්මණයක් නො ලද කල්හි ප්‍රතිසන්ධියට අරමුණු වූ කර්මාදීන් ගෙන් එකක් අරමුණු කරමින් වැල නොකැඩී සිත් උපදින්නේය. භවාංග සිතය යි කියන කර්මාදිය ගෙන උපදනා ප්‍රකෘති සිත් ඇති බව අපට නොදැනේ. සිතේ ජීවන කාලය ඉතා අඩු බැවින් හා අතරක් ඇති නොවන සැටියට නිරුද්ධ වන සිත සමඟ බැඳී උපදනාක් මෙන් අලුත් අලුත් සිත් ඉපදිය යුතු බැවින් ද සිත් උපදිනා තැන සිදු වන්නේ ඉතා වේගවත් වැඩ පිළිවෙලකි. එබඳු වේගවත් වැඩ පිළිවෙලක් කෙරෙන අන් කිසි යන්ත්‍රයක් නැත. චිත්තායුෂය ඉතා ලුහුඬු බැවින් එක් සන්තානයක එකකට එකක් පෙර පසු වී අසුරුසැණක් තුළ දී ඉපද නිරුද්ධ වන සිත් කෝටි ලක්‍ෂ ගණනක් වන බව දක්වා තිබේ. නාගසේන මහ රහතන් වහන්සේ මිළිඳු රජුට අසුරුසැණක් තුළ දී ඉපද නිරුද්ධ වන සිත් වල ප්‍රමාණය උපමාවකින් දක්වන්නාහු "වාහසතං ඛො මහා රාජ, වීහීනං අඩ්ඪචූළඤ්ච වාහා වීහිසත්තම්මණානි ද්වේ ච තුම්බා එකච්ඡරක්ඛණෙ පවත්තචිත්තස්ස එත්තකා වීහි ලක්ඛං ඨපීයමානෙ පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍යුං" යනු වදාළ සේක. එක්සිය පනස් යාළ සතමුණු දෙලාසෙක වී ඇට එක් අසුරු සැණෙක උපදනා සිත් වලට එක ඇටය බැගින් තැබුව හොත් වී සියල්ල ම අවසන් වේය යනු එහි අදහසයි. යාළ නම් වී කරත්තයකි. මෙය එක් අසුරුසැණක උපදනා සිත් වල නියම ප්‍රමාණය දැක්වීම පමණක් නොව බහුභාවය දැක්වීමකි. නිශ්චිත වශයෙන් ම එහි ගණනක් නො දැක්විය හැකිය. එක් අසුරු සැණෙකදී එක් පුද්ගලයකුට මෙපමණ මහත් රාශියක් සිත් උපදීය යන්න මෙය කියවන්නවුන්ට නො පිළිගැණෙන කරුණකි. එය පිළි ගත හැකි වන්නේ චිත්ත තත්ත්වය ගැන වැඩිදුර උගනීමක් ලැබූ පසුවයි. විසදුන් වැඩූ පසුයි. ඒ තැනට පැමිණීමට උත්සාහ කෙරෙත්වා.

*රේරුකානේ චන්දවිමල මාහිමිගේ ලිපියක් ඇසුරිනි.*

**අටසිල් ඉල්ලීමේ වාක්‍ය**

ඕකාස අහං භන්තේ තිසරණෙන සද්ධිං
අට්ඨංග සීලං ධම්මං යාචාමි අනුග්ගහං
කත්වා සීලං දේථ මේ භන්තේ අනුකම්පං උපාදය

දුතියම්පි ඕකාස අහං භන්තේ තිසරණෙන සද්ධිං
අට්ඨංග සීලං ධම්මං යාචාමි අනුග්ගහං
කත්වා සීලං දේථ මේ භන්තේ අනුකම්පං උපාදය

තතියම්පි ඕකාස අහං භන්තේ තිසරණෙන සද්ධිං
අට්ඨංග සීලං ධම්මං යාචාමි අනුග්ගහං
කත්වා සීලං දේථ මේ භන්තේ අනුකම්පං උපාදය

# මෙත් සවිය මෛත්‍රී සංසදය සාමාජික අයදුම්පත

**(ජායා පිටපත්ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

1. සම්පූර්ණ නම ..........
2. ස්ත්‍රී / පුරුෂ භාවය.......... 3. ජාතික හැඳුනුම්පත් අංකය..........
(ජායා පිටපතක් අමුණන්න)
4. උපන් දිනය.......... 5. වයස.......... 6. ආගම..........
7. ස්ථිර ලිපිනය..........
..........විද්‍යුත් තැපැල(e-mail).......... දුරකථන අංකය..........
8. දිස්ත්‍රික්කය.......... 9. විවාහක / අවිවාහක බව..........
10. රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර..........
..........
11. කාර්යාලීය ලිපිනය හා දුරකථන විස්තර..........
12. ලිපි එවිය යුතු ලිපිනය..........
13. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්
    1..........
    2..........
14. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිලිබඳ විස්තර
    1 ..........
    2 ..........
    3 ..........
15. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇඳුම,හෘද රෝග,දියවැඩියාව,රුධිර පීඩනය,අපස්මාරය ) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර
..........
16. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද? ඔව්/නැත.
17. එවැනි මනසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර .
..........
18. ඔබ විසින් සඳහන් කළයුතු මෙහිදි වැදගත්යැයි හැගෙන වෙනත් විස්තර හෝ යෝජනා /අදහස් තිබේනම් මෙහි සඳහන් කරන්න ..........
..........

මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.

දිනය.......... අයදුම්කරුගේ අත්සන..........

**කාර්‍යාලීය ප්‍රයෝජනය සඳහා**

සාමාජික අංකය..........

තේරීම් කමිටුවේ තීරණය

.......... ..........
තේරීම් කමිටු සභාපති විධායක ලේකම්

දිනය..........

සැ.යු. මෙම අයදුම් පත සමගම ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශණ/වැඩමුළු/මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශණ ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම, හැදුනුම්පත් සැපයීම, තැපල් ගාස්තු, විදුලි ගාස්තු,කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිලධාරී මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනිම සඳහා රු.1500/-ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය.(එය ඇතුළත්වීමේ ගාස්තුව රු.500/-හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500/-x2 වශයෙනි) මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදයම් ලබන පවුල්වල අය තම ආදයම් තහවුරුකළ හැකි ලිපි ලේඛන සහිත ග්‍රම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත්තාට පසුව කාර්යාලයට පැමිණ සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ.) කාර්යාලය සඳුදා, අගහරුවාදා හැර සතියේ ඉතිරි දින 5 තුල සෙනසුරාදා, ඉරිදා ද ඇතුලුව සතියේ දින 5ක් විවෘතව පවති. අයදුම් කරන සැමකෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනිමට හේතුව දැනගැනිමට අවශ්‍ය නම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය.

හිසිපරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැදුනුම්පතේ ජායාපිටපතක් සහ 4"x 9" ප්‍රමාණයෙන් යුතුව තම ලිපිනය ලියූ මුද්දරකවර 2 ක් සමග පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් පමණක් යොමු කරන්න.
(අයදුම්පත සමග කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ)
ලිපිනය-ගරු ලේකම්, මෙත්සවිය, ශ්‍රී විජයරාමය, පෙඩ්රිකා පාර, කොළඹ 6. දුරකථනය 011-2505088 0714-014467

# නිවේදන සහ නොමිළයේ පලකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

## වැදගත්

❖ මෙත් සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපි ද, දාන-ශිල-භාවනා වැඩසටහන් වලදී දායකත්වය දරන පිංවතුන්ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන්ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිළයේ පලකරනු ලැබේ. කොළ කැබැලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

❖ සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තිබිය යුතුය. ඔබගේ ලිපිනය ලියාදීම සඳහා භාවනා වැඩසටහන් වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවලද අංකය සදහන් නොකරන හා වැරදි අංක සදහන්කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබීයාම පිළිබදව වග කියනු නොලැබේ.

**- සංස්කාරක -**

## මෙත්සවිය දුරකථන අංක

**මෙත්සවිය තොරතුරු විමර්ශනය කරනවිට පරිපාලන නිලධාරී මහතා** අමතන්න (0714-014467). එම දුරකථන වල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි. අපගේ වෙබ් අඩවිය වන www.methsawiya.org මගින්ද තොරතුරු ලබා ගත හැකිය.

**මීට අමතරව සමලේකම් වරුන් වන තුසිත දොඹගොඩ (071-4454411) හා බී. ඩබ්. චමින්ද (0777-255607** )යන මහතුන් ගේ පුද්ගලික දුරකථන අංකයන් අමතා ද හදිසි තොරතුරු ලබා ගත හැකිය.

**සංසදයේ සභාපති ආචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක (0714 800800 හෝ 0777 309385)** මගින් දහවල් 12.00-1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක් (ඉතා හදිසි අවශ්‍යතාවයකදී ඕනෑම වේලාවක) සිදුකරන්න. (දිනකට දුරකථන පණිවිඩ 30 ක් පමණ ලැබෙන නිසා සාමාජික අංකය හා නම පවසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## කොළඹ ජාතික රෝහලේ වාට්ටු සඳහා බුදු පිළිම සහ අසරණ රෝගීන් සඳහා අවශ්‍ය මූලික ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම

වැල්ලවත්තේ ශ්‍රී විජයාරාමාධිපති අහංගම ආනන්ද ස්වාමීන්වහන්සේගේ අනුසාසනා පරිදි පැවැත්වෙන ඉහත සත්කාර්ය සඳහා බුදු පිළිම, සුදු රෙදි, සැත්කම් වලදී අන්දවන ඇඳුම්, දත් බුරුසු හා දන්තාලේපන, තුවා, සුදු හෝ පාට සරම්, ඇඳ පෝච්චි ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යාග කිරීමට කැමති පින්වතුන් එම ද්‍රව්‍ය ගරු ස්වාමීන්වහන්සේට හෝ කාර්යාලයට පැමිණ භාරදෙන්න.

## නොමිළයේ රෝද පුටු සහ කිහිලි කරු ලබා දීම.

මෙත් සවිය මගින් අසරණ අය සඳහා රෝද පුටු සහ කිහිලි කරු පරිත්‍යාග කිරීමේ වැඩපිළිවෙලක් දියත් කර ඇත. රෝද පු හෝ කිහිලි කරු අවශ්‍ය අය වෙත්නම් මෙත් සවිය වෙත ලිඛිතව ඉල්ලීමක් සිදු කල යුතුය. මෙම වැඩසටහන සඳහා රෝද පුටු සහ කිහිළි කරු ලබා දී දායක වීමට කැමති පින්වතුන් හට එම උපකරණ මෙත් සවිය වෙත ලැබෙන්නට සලස්වන ලෙස මෙත් සිත් පෙරදැරිව ඉල්ලා සිටිමු.

## සංසදයේ ලිපි කටයුතු සඳහා මුද්දර පරිත්‍යාග

සංසදයේ ලිපි ගනුදෙනු කටයුතු සඳහා මුද්දර ගාස්තුව ලෙස විශාල මුදලක් වැයකිරීමට සිදුවී ඇති අතර, මෙම සත්කාරය සඳහා මුද්දර පරිත්‍යාග කිරීමට කැමති පිංවතුන් හට රු.5/=මුද්දර කැමති ප්‍රමාණයක් පරිත්‍යාග කල හැකිය. ලබා දෙන මුද්දර ප්‍රමාණය ඒ සඳහා ඇති ලේඛනයේ සටහන් කරනු ලැබේ. මුද්දර 10 ට වැඩි ඕනෑම ප්‍රමාණයක් පරිත්‍යාග කරන විට සටහන් පොතට ඇතුල් කරනු ලැබේ. මෙත්සවිය සංසදයේ පැවැත්මට හා එහි වර්ධනය සඳහා ඔබගේ ශාසනායැති දයකත්වය අගය කරන්නෙමු.

## සුව සෙත

ප්‍රාණ/විශ්ව ශක්ති ක්‍රම මගින් සමහර රෝග සඳහා සිත දියුණු කරගත් අය මගින් රෝග සුව කිරීමේ නොමිලයේ පැවැත්වෙන වැඩසටහන් ඉරු දින වලදී ශ්‍රී විජයාරාමයේ දී ප.ව.12.00-2.00 දක්වා පැවැත්වේ. කාර්යාලයෙන් විමසා පැමිණෙන්න.

## ප්‍රායෝගික අධිමානසික විද්‍යාව හා පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 14 වන වැඩසටහන

2009.01.18 දින පෙ.ව. 10.00 ට අරඹනු ලබන අතර ඒ සඳහා අයදුම්පත් 2008.12.20 දිනට පෙර භාර ගනු ලැබේ.

**ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ**

## සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්

**SIGHT-N~ STYLE OPTOMETRISTS**

නො: 126ඩී, හයිලෙවල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට)
දුරකථන: 2854758)
(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)
මෙ.ස.සාමාජිකා නෙරංජලා කන්නන්ගර මහත්මිය

## සේවිකාවන් සදහා ඇබෑර්තු

සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස් ආයතනයේ පුහුනුකර සේවයේ යෙදවීම සඳහා සේවිකාවන් අවශ්‍ය වී ඇත අයදුම් පත් පහත සඳහන් ලිපිනයට යොමුකරන්න.

නෙරන්ජලා කන්නන්ගර,
110/42A මහ මේඝ පෙදෙස, මහරගම, දු.ක. 28547558

## රෝගී සහන නවාතැන් පහසුකම් සැපයීමේ සේවය

දුරබැහැර සිට කොළඹ පැමිණෙන අප සාමාජිකයින් වෙනුවෙන් අරඹන ලද ඉහත සඳහන් සේවය 2009 නොවැම්බර් මස සිට පෞද්ගලික අපහසුතාමත නවතා ඇති බව එම සේවය සැපයූ අප සාමාජිකා වජිරා චිත්‍රානි මෝතා මහත්මිය දැනුම් දී ඇත.

බේබි කොට් එකක් පරිත්‍යාග කිරීමට තිබේ. වැඩි විස්තර කාර්යාලයෙන් විමසන්න.

# පිංපොතෙන් බිඳක් .........





මෙත්සවියේ තවත් පුණ්‍ය කටයුත්තක් වන වැල්ලවත්ත ශ්‍රී විජයාරාමයේ
ඉපැරණි ධර්ම ශාලාව ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු මෙත් සවිය උප සභාපති
ඉංජිනේරු සරත් ඉලංගන්තිලක මහතාගේ අධීක්ෂණය යටතේ නොබෝදා ආරම්භ විය





ශ්‍රී විජයාරාමයේ ධර්ම ශාලාව ප්‍රතිසංස්කරණයට රුපියල් ලක්ෂයක
මුදල් ආධාරයක් ලබාදීම.ටී.එල්. මල්ලිකාරච්චි මයා
සමගින් පවුලේ සැම (14-2447, 14-2448 )



12 වන කංඩායම මගින් මෙත් සවියට
දැන්වීම් පුවරුවක් පරිත්‍යාග කිරිම.



ලෝක ප්‍රසිද්ධියටපත් අප අහංගම
ආනන්ද නායක හිමියන්ගේ මෙත් කරුණාව





රෝග සුවයට අත්වැලක් ............




ඔරුගොඩ වත්ත ගව ගාථනාගාරයේ සිට ශ්‍රී විජයාරාමයට
අභය දනය සඳහා රැගෙන එනු ලැබූ ගවයින් ගෙන් කීපදෙනෙක්.

# 2008.09.07 දින නිට්ටඹුව වාරණ ශාන්ත තපෝවන අසපුවේදී පැවැත්වූ දාන-සීල-භාවනා වැඩසටහන









